අ.පො.ස (උ.පෙළ) විභාගය - 2013

ඇගයීම් වාර්තාව

32 - ව්‍යාපාර අධ්‍යයනය



පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2013

ඇගයීම් වාර්තාව

32 - ව්‍යාපාර අධ්‍යයනය



පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

ව්‍යාපාර අධ්‍යයනය

ඇගයීම් වාර්තාව - අ.පොස.(උ.පෙළ) විභාගය - 2013

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගින්

හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පොෂ.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2013 වර්ෂයේ දී මෙම විභාගය සඳහා නව නිර්දේශය යටතේ 209906ක් පාසල් අයදුම්කරුවෝ ද 31723ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පොෂ.(උ.පෙළ) ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ව්‍යාපාර අධ්‍යයනය විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පොෂ.(උ.පෙළ) 2013 විභාගයේ ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා මෙම කාර්ය සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2015 ජනවාරි 19
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

උපදේශකත්වය	:	ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා සංවිධානය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
සම්බන්ධීකරණය	:	ලසික සමරකෝන් සහකාර විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
සංස්කරණය	:	ආචාර්ය ආර්.පී.සී.ආර්. රාජපක්ෂ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ආචාර්ය එම්.ඒ.කේ. ශ්‍රියාලතා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
සැකසුම් කමිටුව	:	ඩබ්.එම්. සුදුබණ්ඩා වාණිජ - ගුරු උපදේශක කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පස්සර. ඩබ්.ඩී. රංජිත් ජයනාද කො/ ශාන්ත පීතර විද්‍යාලය, කොළඹ 04. ෂෙරීන් කණ්ඩම්බි මාර/සුජාතා බාලිකා මහා විදුහල මාතර. ජී.ජී. සුදත් සංජීව කො/ ඩී.ඇස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07. වසන්ත අබේසිංහ විශාඛා විද්‍යාලය, කොළඹ 05.
පරිගණක පිටපත සැකසුම	:	කේ.ඒ.ඩී. තිලානි ලක්මාලී රාජ්‍ය කළමනාකරණ සේවය III එම්.ඩබ්. පියුමි මධුෂාණී පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු
පිටකවරය නිර්මාණය	:	වයි.එස්. අනුරාධි සංවර්ධන නිලධාරී

ඇතුළත පිටු

පිටු අංකය

I කොටස

1 **විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු**

1.1 **විෂය අභිමතාර්ථ** 1

1.2 **විෂය සාධනය පිළිබඳ තොරතුරු**

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2

1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2

1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 **විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය**

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5

1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6

1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7

II කොටස

2 **ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1 **I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 9

2.1.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න අංක 1 සිට 30 දක්වා) 10

2.1.3 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 14

2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක 1-30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ 15

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ අංක 1-30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 16

2.1.6 I ප්‍රශ්න පත්‍රයේ අංක 1-30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා 17

2.1.7 I ප්‍රශ්න පත්‍රයේ අංක 31- 50 තෙක් ප්‍රශ්න, අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18

2.1.8 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ 23

2.1.9 I ප්‍රශ්න පත්‍රයේ අංක 31-50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබා ඇති ආකාරය 24

2.1.10 I ප්‍රශ්න පත්‍රයේ අංක 31-50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා 25

2.2 **II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 26

2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 27

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 52

III කොටස

3 **පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා**

3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 53

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 54

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි අභිමතාර්ථ

මෙම පාඨමාලාව හැදෑරීමෙන් ශිෂ්‍යයා,

- මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම හා සම්බන්ධ ගැටලුවලට, ආයතන හෝ සංවිධාන පදනම් කරගෙන විසඳුම් සෙවිය හැකි ආකාර පිළිබඳ ව නිපුණතා වර්ධනය කර ගනියි.
- ගතික ව්‍යාපාර පරිසරය අවබෝධ කර ගැනීම මගින් එයට අනුවර්තනය වීමට අවශ්‍ය කුසලතා ලබා ගනියි.
- ව්‍යාපාර හා ඊට සම්බන්ධ උපකාරක සේවා පිළිබඳ ව ලබාගන්නා න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව භාවිත කරයි.
- ව්‍යාපාර හා සම්බන්ධ සංකල්ප හා මූලධර්ම අධ්‍යයනය කිරීමටත්, සංකීර්ණ විෂය කරුණු සරල ව ග්‍රහණය කර ගැනීමටත් නිපුණතා වර්ධනය කර ගනියි.
- ව්‍යවසායකත්ව හා කළමනාකරණ කුසලතා වර්ධනය කර ගනියි.
- ව්‍යාපාර පද්ධතියක ශ්‍රීත අතර සමෝධානිත බව පෙන්වා දෙයි.
- දේශීය, කලාපීය හා ගෝලීය වශයෙන් ව්‍යාපාරවල නිරත වීමට අවශ්‍ය මූලික නිපුණතා ලබා ගනියි.
- ශ්‍රී ලංකාව තුළ යහපත් ව්‍යාපාර සංස්කෘතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය ආකල්ප ගොඩනඟා ගනියි.
- සැලසුම් සහගතව ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අවශ්‍ය කුසලතා ලබාගනියි.
- වෘත්තීය භූමිකාවල සාර්ථක ව කටයුතු කිරීමට අවශ්‍ය නිපුණතා ලබා ගනියි.
- සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා කළමනාකරණය හා නූතන තාක්ෂණය භාවිත කිරීමේ කුසලතා වර්ධනය කරගනියි.
- උසස් අධ්‍යාපනයට යොමු වීම උදෙසා ප්‍රවේශයක් ලබා ගනියි.

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

මාධ්‍යය	පාසල්	පෞද්ගලික	එකතුව
සිංහල	51009	3867	54876
දෙමළ	8181	663	8844
ඉංග්‍රීසි	1740	536	2276
එකතුව	**60930**	**5066**	**65996**

වගුව 1

1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පාසල් අයදුම්කරුවන්		පෞද්ගලික අයදුම්කරුවන්		එකතුව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
A	6717	11.02	325	6.42	7042	10.67
B	8832	14.50	592	11.69	9424	14.28
C	16643	27.31	1224	24.16	17867	27.07
S	18065	29.65	1505	29.70	19570	29.65
F	10673	17.52	1420	28.03	12093	18.32
එකතුව	**60930**	**100.00**	**5066**	**100.00**	**65996**	**100.00**

වගුව 2

1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		අසමත් (F)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
1. කොළඹ	9255	1384	14.95	1387	14.99	2393	25.86	2613	28.23	7777	84.03	1478	15.97
2. ගම්පහ	5991	906	15.12	829	13.84	1500	25.04	1670	27.88	4905	81.87	1086	18.13
3. කළුතර	2938	376	12.80	395	13.44	825	28.08	839	28.56	2435	82.88	503	17.12
4. මහනුවර	3536	319	9.02	468	13.24	923	26.10	1097	31.02	2807	79.38	729	20.62
5. මාතලේ	1003	48	4.79	97	9.67	225	22.43	365	36.39	735	73.28	268	26.72
6. නුවරඑළිය	1403	74	5.27	163	11.62	376	26.80	476	33.93	1089	77.62	314	22.38
7. ගාල්ල	2964	353	11.91	354	11.94	715	24.12	869	29.32	2291	77.29	673	22.71
8. මාතර	2128	195	9.16	272	12.78	555	26.08	635	29.84	1657	77.87	471	22.13
9. හම්බන්තොට	1239	89	7.18	143	11.54	312	25.18	422	34.06	966	77.97	273	22.03
10. යාපනය	1077	38	3.53	93	8.64	289	26.83	390	36.21	810	75.21	267	24.79
11. කිලිනොච්චි	207	1	0.48	5	2.42	62	29.95	79	38.16	147	71.01	60	28.99
12. මන්නාරම	204	3	1.47	16	7.84	52	25.49	77	37.75	148	72.55	56	27.45
13. වව්නියාව	316	10	3.16	50	15.82	84	26.58	89	28.16	233	73.73	83	26.27
14. මුලතිව්	192	1	0.52	4	2.08	39	20.31	69	35.94	113	58.85	79	41.15
15. මඩකලපුව	810	62	7.65	131	16.17	286	35.31	229	28.27	708	87.41	102	12.59
16. අම්පාර	1283	77	6.00	158	12.31	367	28.60	437	34.06	1039	80.98	244	19.02
17. ත්‍රිකුණාමලය	668	30	4.49	55	8.23	168	25.15	218	32.63	471	70.51	197	29.49
18. කුරුණෑගල	3244	269	8.29	409	12.61	873	26.91	1051	32.40	2602	80.21	642	19.79
19. පුත්තලම	1495	185	12.37	273	18.26	424	28.36	451	30.17	1333	89.16	162	10.84
20. අනුරාධපුරය	1697	133	7.84	208	12.26	407	23.98	560	33.00	1308	77.08	389	22.92
21. පොළොන්නරුව	836	39	4.67	92	11.00	214	25.60	258	30.86	603	72.13	233	27.87
22. බදුල්ල	1877	110	5.86	207	11.03	456	24.29	608	32.39	1381	73.57	496	26.43
23. මොනරාගල	941	93	9.88	133	14.13	249	26.46	297	31.56	772	82.04	169	17.96
24. රත්නපුරය	2563	285	11.12	387	15.10	671	26.18	787	30.71	2130	83.11	433	16.89
25. කෑගල්ල	1708	114	6.67	206	12.06	417	24.41	550	32.20	1287	75.35	421	24.65
සමස්ත දිවයින	**49575**	**5194**	**10.48**	**6535**	**13.18**	**12882**	**25.98**	**15136**	**30.53**	**39747**	**80.18**	**9828**	**19.82**

වගුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91-100	110	0.17	65996	100.00
81-90	2180	3.30	65886	99.83
71-80	6927	10.50	63706	96.53
61-70	10667	16.16	56779	86.03
51-60	12954	19.63	46112	69.87
41-50	13412	20.32	33158	50.24
31-40	11351	17.20	19746	29.92
21-30	6544	9.92	8395	12.72
11-20	1696	2.57	1851	2.80
01-10	153	0.23	155	0.23
00-00	2	0.00	2	0.00

වගුව 4

ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා පෙනී සිටි 65996 දෙනා අතුරෙන්, 31-40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 11351කි. එය ප්‍රතිශතයක් වශයෙන් 17.20කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 19746ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 29.92කි.

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 03 වන ප්‍රශ්නයටය. එහි ප්‍රතිශතය 94%කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 44 වන ප්‍රශ්නයටය. එහි ප්‍රතිශතය 13%කි.

1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය



උදාහරණයක් වශයෙන් ගතහොත්, පිළිතුරු සැපයීම සඳහා ප්‍රශ්න තෝරා ගැනීමේදී 01 වන ප්‍රශ්නය 98%ක් පමණ පිරිසක් තෝරාගෙන ඇති අතර 07 වන ප්‍රශ්නය තෝරාගත් පිරිස 51%ක් පමණ වේ.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය



උදාහරණයක් වශයෙන් මෙහි 01 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. මෙම ප්‍රස්තාරයට අනුව එම ලකුණුවලින් 16 - 20 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් 23%ක් පමණ වේ. 11 -15 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් 40%ක් පමණ වේ. 6 -10 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් 28% ක් පමණ වේ. 0-5 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් 9% ක් පමණ වේ.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.4 **II** ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



පුස්තාරය 4.1 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් කොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)


අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2013
32 - ව්‍යාපාර අධ්‍යයනය - II පත්‍රය - II කොටස
ප්‍රශ්නවල පහසුතා දර්ශකය
පහසුතා දර්ශකය
1.0
0.9
0.8
0.7
0.6
0.5
0.4
0.3
0.2
0.1
0.0
අ
ආ
(i)
(ii)
(iii)
(iv)
(v)
5
6
7
8
ප්‍රශ්න අංකය - කොටස් හා අනුකොටස්

ප්‍රස්තාරය 4.2

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 02 කි. මුළු ලකුණු 100කි.

* **1 - 30 දක්වා බහුවරණ ප්‍රශ්න 30කින් ද 31 - 40 දක්වා සුදුසු වචන යොදා හිස්තැන් පිරවීමේ ප්‍රශ්න 10කින්ද, 41 - 50 දක්වා නිශ්චිත පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින්ද සමන්විතය.**

* **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයීම අපේක්ෂිතය.**

* **එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

2.1.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න අංක 1 සිට 30 දක්වා)

1. ව්‍යාපාරයක පදනම වනුයේ,
(1) මුදල් ය. (2) භාණ්ඩ හා සේවා ය. (3) ලාභය ය.
(4) ගනුදෙනුකරු ය. (5) යෙදවුම් සහ නිමැවුම් ය. (.....)

2. නවීන තාක්ෂණික උපකරණ සහිත බෝට්ටු යොදා ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම,
(1) ප්‍රාථමික නිෂ්පාදනයකි. (2) ද්විතියික නිෂ්පාදනයකි.
(3) තෘතීයික නිෂ්පාදනයකි. (4) ප්‍රවාහ නිෂ්පාදනයකි.
(5) කාර්ය නිෂ්පාදනයකි. (.....)

3. ස්වාභාවික පරිසරයේ පවත්නා සමහර සම්පත්, සීමිත එහෙත් නැවත අලුත් කළ හැකි *(finite - renewable)* ඒවා වන අතර සමහරක් සීමිත එහෙත් නැවත අලුත් කළ නොහැකි *(finite - nonrenewable)* ඒවා ය.
A - වන *(forest)* B - දියමන්ති *(diamond)* C - මසුන් *(fish)*
D - ගල් අඟුරු *(coal)* E - ආහාර *(food)* F - ඛනිජ තෙල් *(petroleum)*
ඉහත සඳහන් දෑ අතුරින් සීමිත එහෙත් **නැවත අලුත් කළ නොහැකි** සම්පත් වනුයේ,
(1) A, B, C, D හා E ය. (2) A, B, D හා E ය. (3) A, C හා D ය.
(4) B, C හා F ය. (5) B, D හා F ය. (.....)

4. "ව්‍යාපාර සමාජ වගකීම්" සංකල්පය යනු,
(1) "නීතියට අනුව ව්‍යාපාර කටයුතු සිදු කළ යුතු ය." යන අදහස ය.
(2) "කොටස්කරුවන්ගේ අරමුණු ඉටු කළ යුතු ය." යන අදහස ය.
(3) "ව්‍යාපාරික තීරණ ගැනීමේ දී කොටස්කරුවන්ගේ අරමුණු නොසලකා හැරිය යුතු ය." යන අදහස ය.
(4) "ව්‍යාපාරික තීරණ ගැනීමේ දී ඇල්මැති පාර්ශ්වයන්ගේ අරමුණු සැලකිල්ලට ගත යුතු ය." යන අදහස ය.
(5) "ව්‍යාපාරික තීරණ ගැනීමේ දී ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා සැලකිල්ලට ගත යුතු ය." යන අදහස ය.
(.....)

5. රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය යටතට ඇතුළත් වන්නේ,
(1) පොළී හා මුදල් සැපයුම පාලනයයි. (2) බදු හා ගාස්තු පාලනයයි.
(3) වර්තන වියදම් පාලනයයි. (4) ප්‍රාග්ධන වියදම් පාලනයයි.
(5) රාජ්‍ය ආදායම් හා වියදම් පාලනයයි. (.....)

6. ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති සඳහා වූ අන්තර්ජාතික ප්‍රමිතිය කුමක් ද?
(1) ISO 9001 : 2008 (2) ISO 14001 : 2004 (3) ISO 22000 : 2005
(4) ISO 27000 (5) OHSAS 18001 : 2007 (.....)

7. "සීමිත වගකීම්" ලැබීමෙන් අත්වන ප්‍රතිඵලය වන්නේ
(1) අයිතිකරුවන්ගේ අවදානම ආයෝජනය කළ මුදලට පමණක් නොව ඔවුන්ගේ පෞද්ගලික වත්කම්වලට ද පැතිරීම ය.
(2) අයිතිකරුවන්ගේ මූල්‍යමය බැඳීම් ඔවුන් ව්‍යාපාරයට ආයෝජනය කළ මුදලින් ඔබ්බට පැතිරී නොයෑම ය.
(3) ව්‍යාපාරයට මුදල් ආයෝජනය අවදානමින් තොර වීම ය.
(4) අයිතිකරුවන්ට ව්‍යාපාරයේ පාලනය කෙරෙහි බලපෑමක් කළ නොහැකි වීම ය.
(5) ව්‍යාපාරයට ආයෝජනය කළ මුදල් ආපසු ලැබීම සහතික වීම ය. (.....)

8. "වරලත් ව්‍යාපාරයක්" යනු
(1) සමාගම් දෙකක් හෝ වැඩි ගණනක් අතර වූ බද්ධ ව්‍යාපාරයකි.
(2) සමාගමක් විසින් තවත් සමාගමක් අත්පත් කර ගැනීමයි.
(3) සමාගමක් බහු ජාතික සමාගමක් බවට පරිවර්තනය වීමකි.
(4) පවත්නා ව්‍යාපාරයක නම, සන්නම හා වෙළඳ ක්‍රමය භාවිත කිරීමකි.
(5) රජයට හිමි රජයේ පාලනය යටතේ වූ ව්‍යාපාරයකි. (.....)

9. A - ආයෝජිත ප්‍රාග්ධනය B - සේවක සංඛ්‍යාව C - විකුණුම් පිරිවැටුම
D - වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය E - නිෂ්පාදන ක්‍රමය
ඉහත සඳහන් දේ අතුරෙන් ව්‍යාපාරයක ප්‍රමාණය මැනීමට බහුලව භාවිත කරන මිනුම් වනුයේ,
(1) A හා B පමණි. (2) A, B හා C පමණි. (3) A, B, C හා D පමණි.
(4) A, B, C හා E පමණි. (5) A, B, C, D හා E යන සියල්ල ම ය. (.....)

10. A - ජංගම ගිණුම්වල ශේෂ B - ඉතිරිකිරීම් ගිණුම්වල ශේෂ C - නෝට්ටු හා කාසි
D - ණයපත් හා හරපත් E - වලංගු චෙක්පත්

ඉහත සඳහන් දෑ අතුරෙන් ආසන්න මුදල් ලෙස පිළිගත හැක්කේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A හා E පමණි.
(4) B හා D පමණි. (5) B පමණි. (.....)

11. පහත සඳහන් වන්නේ ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක බැංකු කිහිපයකි.

A - ජාතික ඉතිරි කිරීමේ බැංකුව B - මහජන බැංකුව C - ජාතික සංවර්ධන බැංකුව
D - DFCC වර්ධන බැංකුව E - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව F - සණසු සංවර්ධන බැංකුව

මේවා අතුරෙන් බලපත්‍රලාභී විශේෂිත බැංකු කවරේ ද?

(1) C, E හා F පමණි. (2) A , C හා D පමණි. (3) B , D හා E පමණි.
(4) D, E හා F පමණි. (5) A , E හා F පමණි. (.....)

12. සිසිර ඔහු පදිංචි නිවස සඳහා X රක්ෂණ සමාගමෙන් රු. 200 000 රක්ෂණ ඔප්පුවක් ද Y සමාගමෙන් රු. 400 000 රක්ෂණ ඔප්පුවක් ද ලබාගෙන තිබුණි. ගින්නකින් මෙම නිවසට රු. 300 000 අලාභයක් සිදුවිණි. දයකත්ව මූලධර්මයට අනුව X හා Y රක්ෂණ සමාගම්වලින් ගෙවනු ලබන අලාභය කොපමණ ද?

(1) X සමාගම රු. 200 000 යි. Y සමාගම රු. 400 000 යි.
(2) X සමාගම රු. 150 000 යි. Y සමාගම රු. 150 000 යි.
(3) X සමාගම රු. 200 000 යි. Y සමාගම රු. 100 000 යි.
(4) X සමාගම රු. 100 000 යි. Y සමාගම රු. 200 000 යි.
(5) X සමාගම රු. 200 000 යි. Y සමාගම රු. 300 000 යි. (.....)

13. සවිස්තර තොරතුරු විශාල ප්‍රමාණයක් සන්නිවේදනය කිරීමට බලාපොරොත්තු වන කළමනාකරුවකුට ඒ සඳහා උපයෝගී කර ගත හැකි වඩාත් යෝග්‍ය සන්නිවේදන ක්‍රමය කුමක් ද?

(1) ලිඛිත මෙමෝ පත්‍රය *(memo)* (2) මුහුණට මුහුණ ලා පවත්වන රැස්වීම
(3) දැනුම් පුවරුව *(Noticeboard)* (4) දුරකථනය
(5) වාර්තාව *(Report)* (.....)

14. විද්‍යුත් සන්නිවේදන ක්‍රමයක් ලෙස බහුලව භාවිත කරන විද්‍යුත් තැපෑලෙහි *(e-mail)* දුර්වලතාවක් ලෙස පිළිගත හැක්කේ,

(1) වේගවත් නොවීම ය. (2) හුදකලා වීමේ හැඟීමක් නිර්මාණය වීම ය.
(3) පසුපෝෂණයක් නොමැති වීම ය. (4) පිරිවැය අධික වීම ය.
(5) පණිවුඩය තේරුම් ගැනීමට අපහසු වීම ය. (.....)

15. මෙහෙවර ප්‍රකාශය *(Mission Statement)* යනු

(1) ව්‍යාපාරයක මූල්‍ය සැලැස්මකි.
(2) සේවකයින් වෙනුවෙන් සකස් කළ ඉලක්ක දක්වෙන ලියවිල්ලකි.
(3) ව්‍යාපාරයේ පරමාර්ථ *(objectives)* පැහැදිලි කෙරෙන ලියවිල්ලකි.
(4) ව්‍යාපාරයේ සමස්ත අරමුණ *(purpose)* පැහැදිලි කෙරෙන ලියවිල්ලකි.
(5) ව්‍යාපාරයේ අලෙවිකරණ උපායමාර්ග විස්තර කෙරෙන ලියවිල්ලකි. (.....)

16. "සඵලදයකත්වය" (effectiveness) යන සංකල්පය වඩා හොඳින් හැඳින්වෙන ප්‍රකාශය තෝරන්න.

(1) යෙදවුම්, නිමැවුම් බවට පරිවර්තනය කිරීමට ආයතනයකට ඇති හැකියාව
(2) ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා යෙදවුම් ඵලදායී ලෙස භාවිත කරමින් අරමුණු ඉටු කර ගැනීමට ආයතනයකට ඇති හැකියාව
(3) නිෂ්පාදන පිරිවැය සහ අනෙකුත් වියදම් අවම කර ගැනීමට ආයතනයකට ඇති හැකියාව
(4) අවම යෙදවුමකින් උපරිම නිමැවුමක් ලබා ගැනීමට ආයතනයකට ඇති හැකියාව
(5) කෙටිකාලීන හා දිගුකාලීන ණය ආපසු ගෙවීමට ආයතනයකට ඇති හැකියාව (.....)

17. A - නිශ්චිත අරමුණු හා පරමාර්ථ මත පදනම් වීම B - හිඟ සම්පත් වඩාත් ලාභදායී ලෙස ප්‍රයෝජනයට ගැනීම
C - ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට හැකි වීම D - නම්‍යශීලී වීම
E - වෙනස්වන පරිසරය තුළ කටයුතු කිරීමට මහ පෙන්වීම F - ආයතනයේ සෑම සාමාජිකයකුටම තේරුම් ගත හැකිවීම
ඉහත සඳහන් ද අතුරින් සැලසුම් සකස් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු මූලධර්ම ලෙස පිළිගනු ලබන්නේ,
(1) A හා B පමණි. (2) C හා D පමණි. (3) C, D හා F පමණි.
(4) A, C, D හා E පමණි. (5) A, C, D හා F පමණි. (.....)

18. පහත සඳහන් අවස්ථා අතුරෙන් JIT තොග පාලන ක්‍රමය වඩාත් ම යෝග්‍ය වන්නේ,
(1) තොග යල් පැනීම් පිළිබඳ අවදානම ඉහළ මට්ටමක පවතින විට ය.
(2) ගෝලීයකරණයේ බලපෑම් වැඩි වන විට ය.
(3) නිෂ්පාදකයා හා සැපයුම්කරු අතර පවත්නා සම්බන්ධතාව දුර්වලව පවතින විට ය.
(4) සැපයුම්කරුවන් කර්මාන්තශාලාවට සමීපව ස්ථානගත වී සිටින විට ය.
(5) නිෂ්පාදන පිරිවැය පහළ මට්ටමක පවතින විට ය. (.....)

19. CAM - පරිගණක ආධාර නිෂ්පාදනය හොඳින් විස්තර කෙරෙන ප්‍රකාශය තෝරන්න.
(1) නිෂ්පාදිත නිර්මාණය කිරීමට පරිගණක යොදා ගැනීමේ ක්‍රමය
(2) නිෂ්පාදිත ක්‍රියාවලිය කළමනාකරණයට පරිගණක යොදා ගැනීමේ ක්‍රමය
(3) අලෙවිකරණයට ආධාරකයක් වශයෙන් අන්තර්ජාලය යොදා ගැනීමේ ක්‍රමය
(4) තොග පාලනය සඳහා පරිගණක යොදා ගැනීමේ ක්‍රමය
(5) නිෂ්පාදිත නිර්මාණයටත්, නිෂ්පාදන ක්‍රියාවලිය කළමනාකරණයටත් පරිගණක යොදා ගැනීමේ ක්‍රමය (.....)

20. සජිත් වෙබ් අඩවි නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක නිමිකරුවෙකි. ව්‍යාපාර ආයතන, පාසැල්, උසස් අධ්‍යාපන ආයතන ගණනාවක් සඳහා වෙබ් අඩවි නිර්මාණය කර දීමෙන් ඔහු ජනප්‍රියත්වයට පත්ව සිටී. සජිත්ගේ ව්‍යාපාරය යොදා ගන්නා නිෂ්පාදන ක්‍රමය කුමක් ද?
(1) කාර්ය නිෂ්පාදනය (job production) (2) කාණ්ඩ නිෂ්පාදනය (batch production)
(3) ප්‍රවාහ නිෂ්පාදනය (flow production) (4) CAM - පරිගණක ආධාරක නිෂ්පාදනය
(5) CIM - පරිගණක සමෝධානික නිෂ්පාදනය (.....)

21. A - සම්බන්ධතා අලෙවිකරණය B - සූක්ෂම අලෙවිකරණය C - අභ්‍යන්තර අලෙවිකරණය
D - කාර්යඵල අලෙවිකරණය E - ප්‍රතික්‍රියා අලෙවිකරණය F - සමෝධානික අලෙවිකරණය
ඉහත සඳහන් දෑ අතුරෙන් සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයේ විවිධ **හතර** වනුයේ
(1) A, B, C හා D ය. (2) A, C, D හා E ය. (3) A, C, D හා F ය.
(4) B, C, D හා E ය. (5) C, D, E හා F ය. (.....)

22. පාසල්වල ක්‍රීඩා හා සංස්කෘතික සංදර්ශන සඳහා ව්‍යාපාරිකයින් අනුග්‍රාහකත්වය ලබා දෙන අවස්ථා ඔබ දැක ඇත. මෙම අනුග්‍රාහකත්ව *(sponsorships)* ඇතුළත් කළ හැක්කේ ප්‍රවර්ධන මිශ්‍රයේ කවර විචල්‍යයට ද?
(1) ප්‍රචාරණයට ය. (2) විකුණුම් ප්‍රවර්ධනයට ය.
(3) මහජන සම්බන්ධතා හා ප්‍රසිද්ධියට ය. (4) පෞද්ගලික අලෙවියට ය.
(5) අන්තර්ක්‍රියාකාරිත්ව අලෙවිකරණයට ය. (.....)

23. A - සන්නම B - ගුණත්වය C - SLS ලාංඡනය D - ඇසුරුම E - නිමාව F - අංගෝපාංග
ඉහත සඳහන් දෑ අතුරෙන් නිෂ්පාදිතයක අනන්‍යතාව තහවුරු කර ගැනීමට උපකාරී වන්නේ
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A හා D පමණි.
(4) A, C හා D පමණි. (5) A, C, D, E හා F පමණි. (.....)

24. පහත සඳහන් දෑ අතුරෙන් අභ්‍යන්තර මූල්‍ය මාර්ගයක් ලෙස **නොසැලකෙන්නේ**
(1) රඳවා ගත් ලාභ ය. (2) කොටස් නිකුතුව ය.
(3) අතිරේක වත්කම් විකිණීම ය. (4) ක්ෂය සඳහා වෙන් කිරීම ය.
(5) කාරක ප්‍රාග්ධනය අඩු කිරීම ය. (.....)

25. පහත සඳහන් ප්‍රකාශ දෙක සැලකිල්ලට ගෙන නිවැරදි පිළිතුර තෝරන්න.
1 - සමාගමක දිගුකාලීන වර්ධනය සමහර විට කොටස් හිමියන්ගේ පරමාර්ථ සමග ගැටිය හැකි ය.
2 - කොටස් හිමියන් ඉහළ ලාභාංශ බලාපොරොත්තු වන විට රඳවා ගත් ලාභ අඩු විය හැකි ය.
(1) පළමු ප්‍රකාශය නිවැරදි ය. එහෙත් දෙවැන්න වැරදි ය.
(2) පළමු ප්‍රකාශය වැරදි ය. එහෙත් දෙවැන්න නිවැරදි ය.
(3) පළමු ප්‍රකාශය හා දෙවැනි ප්‍රකාශය යන දෙක ම නිවැරදි ය.
(4) පළමු ප්‍රකාශය හා දෙවැනි ප්‍රකාශය යන දෙක ම වැරදි ය.
(5) ප්‍රකාශ දෙක අතර සම්බන්ධතාවක් නැත. (.....)

26. පහත දක්වෙන්නේ ආකර්ෂණය හා තෝරා ගැනීමේ ක්‍රියාවලියේ පියවර කිහිපයකි.
A - රැකියා දැන්වීම පිළියෙල කිරීම B - ඉල්ලුම්කරුවන්ගේ කෙටි ලැයිස්තුවක් *(short list)* පිළියෙල කිරීම
C - රැකියා විස්තරය පිළියෙල කිරීම D - සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම
E - රැකියා පිරිවිතරය පිළියෙල කිරීම
මේවා අනුපිළිවෙළට ගැළපුවහොත් නිවැරදි පිළිතුර වන්නේ
(1) A, C, E, B, D ය. (2) C, E, A, B, D ය. (3) C, E, B, A, D ය.
(4) A, B, E, C, D ය. (5) A, B, D, E, C ය. (.....)

27. පහත සඳහන් හැඳින්වීම් අතුරින් **වැරදි** හැඳින්වීම වනුයේ කුමක් ද?

(1) අනුස්ථාපනය = අලුතින් බඳවා ගත් සේවකයන්ට සේවා ස්ථානයෙන් බාහිරව පුහුණුව ලබා දීම

(2) රැකියා විග්‍රහය = කිසියම් රැකියාවක් හොඳින් කිරීමට අවශ්‍ය වන්නේ කවුරුන් ද යන්න අධ්‍යයනය කිරීම

(3) රැකියාව තුළ පුහුණුව = වැඩ ස්ථානයේ දී ම උපදෙස් ලබා දීම

(4) සාමූහික කේවල් කිරීම = වෘත්තීය ගැටලුවක් සම්බන්ධයෙන් වෘත්තීය සමිතිය හා කළමනාකරණය අතර පවත්නා සාකච්ඡා

(5) කාර්ය මණ්ඩල ඇගයීම = සේවකයින්ගේ සඵලදායකත්වය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (.....)

28. පහත සඳහන් ද අතුරෙන් නොරතුරු පද්ධතියක කාර්යයක් ලෙස පිළිගත **නොහැක්කේ.**

(1) ආදානය ය. (2) අදළත්වය ය. (3) සැකසීම ය.

(4) ප්‍රතිදානය ය. (5) ගබඩා කිරීම ය. (.....)

29. පහත වගුවේ X වලින් නොරතුරු පද්ධතියක උපාංග ද Y වලින් උපාංගවලට අදළ අයිතම ද දක්වේ.

X: උපාංග	Y: අයිතම
A දෘඩාංග	1. නීති රීති හා ප්‍රතිපත්ති
B මෘදුකාංග	2. (Microsoft) මයික්‍රොසොෆ්ට්
C ජීවාංග	3. මොනිටරය
D ආයතනිකාංග	4. පරිශීලක
E ක්‍රියාපටිපාටි	5. (Windows) වින්ඩෝස්

උපාංග හා ඊට අදළ අයිතම නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

(1) A-3, B-5, C-4, D-2, E-1 (2) A-3, B-2, C-4, D-5, E-1

(3) A-3, B-5, C-4, D-1, E-2 (4) A-3, B-2, C-1, D-5, E-4

(5) A-5, B-3, C-2, D-1, E-4 (.....)

30. අලුතින් ව්‍යාපාරයක් ආරම්භ කරන විට මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පිළියෙල කිරීම ප්‍රයෝජනවත් ය. එසේ කිරීමෙන් ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභ වන්නේ,

(1) ව්‍යාපාරය ලාභදායී ලෙස පවත්වාගෙන යන්නේ ද'යි අයිතිකරුවන්ට දැන ගත හැකි වීම ය.

(2) නිෂ්පාදනයේ සමච්ඡේද ලක්ෂ්‍යය එමගින් පෙන්නුම් කිරීම ය.

(3) ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් එමගින් දැන ගත හැකි වීම ය.

(4) ව්‍යාපාරයේ ප්‍රාග්ධන ව්‍යුහය එමගින් දැන ගත හැකි වීම ය.

(5) ව්‍යාපාරයේ ද්‍රවශීලතාව එමගින් පෙන්නුම් කළ හැකි වීම ය. (.....)

2.1.3 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01.	4	16.	2
02.	1	17.	5
03.	5	18.	1
04.	4	19.	2
05.	1	20.	1
06.	3	21.	3
07.	2	22.	3
08.	4	23.	3
09.	2 සහ 3	24.	2
10.	5	25.	3
11.	5	26.	2
12.	4	27.	1
13.	5	28.	2
14.	2	29.	1
15.	4	30.	5

වගුව 05

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **60**කි.

2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ :



2.1.5 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය	එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය					
		1	**2**	**3**	**4**	**5**	Missing
1	4	6%	35%	17%	**35%**	7%	-
2	1	**67%**	15%	9%	5%	4%	-
3	5	1%	1%	2%	2%	**94%**	-
4	4	8%	1%	1%	**77%**	13%	-
5	1	**55%**	6%	3%	1%	34%	-
6	3	23%	20%	**42%**	5%	10%	-
7	2	4%	**86%**	5%	4%	1%	-
8	4	8%	4%	5%	**76%**	7%	-
9	2 සහ 3	17%	**33%**	**18%**	13%	19%	-
10	5	33%	11%	14%	14%	**28%**	-
11	5	12%	25%	10%	14%	**40%**	-
12	4	2%	12%	3%	**78%**	5%	-
13	5	9%	60%	5%	1%	**25%**	-
14	2	2%	**29%**	37%	26%	5%	-
15	4	2%	6%	26%	**64%**	2%	-
16	2	4%	**68%**	5%	22%	2%	-
17	5	6%	3%	5%	26%	**60%**	-
18	1	**66%**	6%	7%	14%	7%	-
19	2	15%	**32%**	6%	6%	41%	-
20	1	**44%**	12%	7%	18%	19%	-
21	3	5%	11%	**72%**	4%	6%	1%
22	3	17%	11%	**66%**	1%	4%	-
23	3	3%	11%	**43%**	24%	19%	-
24	2	3%	**61%**	10%	15%	11%	-
25	3	14%	24%	**48%**	5%	9%	-
26	2	37%	**45%**	4%	7%	7%	-
27	1	**58%**	20%	6%	12%	5%	-
28	2	2%	**80%**	4%	3%	11%	-
29	1	**50%**	29%	16%	2%	4%	-
30	5	24%	3%	10%	11%	**51%**	-

වගුව 06

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.
* Missing යනුවෙන් දක්වා ඇත්තේ, ප්‍රශ්නය සඳහා වරණ තෝරා නැති හෝ එක් වරණයකට වඩා වැඩියෙන් වරණ තෝරා ගෙන ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය යි.
* 9 වන ප්‍රශ්නය සඳහා 2 සහ 3 වරණ නිවැරදි ලෙස සලකා ඇත.
* I පත්‍රයේ ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා පිළිතුරු සැපයීමේ දී,

  උදා:- 07 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් එනම් 86% ක් නිවැරදි ප්‍රතිචාර දක්වා තිබේ.

  අයදුම්කරුවන්ගෙන් අඩු ම ප්‍රතිශතයක් එනම් 25% ක් නිවැරදි ප්‍රතිචාර දක්වා ඇති ප්‍රශ්නය වන්නේ 13 වැනි ප්‍රශ්නය යි. මෙම ප්‍රශ්න 30 අතුරින් පහසුතාව අඩු ම ප්‍රශ්නය වන්නේ 13 වැනි ප්‍රශ්නය යි.

2.1.6 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා :

සමස්තයක් ලෙස ගෙන බලන විට I පත්‍රයේ 01 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී අංක 03, 04, 07, 08, 12 සහ 28 යන ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගෙන් 75% වඩා ඉහළ ප්‍රතිශතයක් නිවැරදි පිළිතුර සපයා ඇත.

ප්‍රශ්න අංක 01, 10, 13, 14 සහ 19 යන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර සපයා ඇති අයදුම්කරුවන් ප්‍රතිශතය 40%ට අඩු ප්‍රමාණයකි. ඒවායේ ප්‍රතිශත පිළිවෙළින් 35%, 28%, 25%, 29% හා 32% කි.

ව්‍යාපාර පදනම හා සම්බන්ධ 01 වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය වන 4 වරණය තෝරාගෙන ඇති ප්‍රතිශතය 35%කි. එමෙන්ම 2 වරණය තෝරාගත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 35% කි. ව්‍යාපාර පදනමෙහි ප්‍රමුඛතා අනුපිළිවෙළ පිළිබඳව නිවැරදි අවබෝධයක් නොතිබීම අසාර්ථක පිළිතුරු සැපයීමට ප්‍රධාන හේතුව වී ඇති බව පෙනේ.

මුදල් හා මූල්‍ය ආයතන සම්බන්ධ 10 වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය වන 5 වරණය තෝරාගෙන ඇති ප්‍රතිශතය 28%ක් වන අතර, 1 වරණය තෝරාගත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 33% කි. ආසන්න මුදල් පිළිබඳව සංකල්පීය දැනුම හා අවබෝධය අයදුම්කරුවන් තුළ නොතිබීම මෙයට හේතු වී ඇති බව පෙනේ. එම නිසා ආසන්න මුදල් පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම වර්ධනය කිරීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් විය යුතුයි.

සන්නිවේදනය හා සම්බන්ධ 13 වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය වන 5 වරණය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 25%ක් වන අතර, 2 වරණය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 60% කි. මෙහි දී ප්‍රශ්නයේ හරය පිළිබඳව අවබෝධයකින් තොරව පිළිතුරු සපයා ඇති බව පෙනේ. එම නිසා සමස්ත ප්‍රශ්නය හොඳින් කියවා අවබෝධ කර ගැනීමෙන් පසු නිවැරදි වරණය තෝරා ගැනීමට සිසුන්ට උපදෙස් ලබා දිය යුතු ය.

සන්නිවේදනය හා සම්බන්ධ 14 වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය වන 2 වරණය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 29%ක් වන අතර, 3 හා 4 වරණ තෝරා ගෙන ඇති ප්‍රතිශතය පිළිවළෙන් 37% ක් හා 26% කි.

විද්‍යුත් සන්නිවේදනය භාවිතයේ දී මතුවන නව ප්‍රවණතාවයන් පිළිබඳව සිසුන් තුළ අවබෝධයක් නොමැති වීම මෙයට හේතු වී ඇති බව පෙනේ. එම නිසා ඒ පිළිබඳව දැනුම හා භාවිතය පිළිබඳව කුසලතාව සිසුන්ට ලබා දිය යුතුයි.

මෙහෙයුම් කළමනාකරණය හා සම්බන්ධ 19 වන ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය වන 2 වරණය තෝරා ගත් ප්‍රතිශතය 32% කි. 5 වරණය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 41% කි. එයට හේතු වී ඇත්තේ CAD, CAM, CIM, CNC යන තාක්ෂණ ශිල්පීය ක්‍රම පිළිබඳව සංකල්පීය අවබෝධය සිසුන්ට නොමැති බවය. එම සංකල්ප හා ඒවා අතර ඇති වෙනස්කම් පිළිබඳව න්‍යායාත්මක අවබෝධය අයදුම්කරුවන්ට ලබා දිය යුතු ය.

2.1.7 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්න, අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

31. (අ) පුද්ගලයන්ගේ විශ්වාස *(beliefs)*, අගනාවන් *(values)*, ප්‍රතිමාන *(norms)* ..... පරිසරයේ සාධක ලෙස හඳුන්වනු ලැබේ.

(ආ) ව්‍යාපාරයකට අදළ ආචාරධර්ම ලිඛිතව ප්‍රකාශයට පත් කළ විට එය හඳුන්වනුයේ .... ලෙස ය.

පිළිතුරු

(අ) සමාජ හා සංස්කෘතික / සාර්ව **(ලකුණු 01යි)**

(ආ) ආචාර ධර්ම සංග්‍රහය / ආචාර ධර්ම පද්ධතිය **(ලකුණු 01යි)**

32. (අ) ලෝක පාරිභෝගික ජනතාවගේ අයිතීන් රැක ගැනීමට කටයුතු කරන සංවිධානය .... යන නමින් හඳුන්වනු ලැබේ.

(ආ) එම සංවිධානය විසින් ප්‍රකාශයට පත් කර ඇති ජගත් පාරිභෝගික දිනය සෑම වසරක ම ..... දිනට යෙදී ඇත.

පිළිතුරු

(අ) පාරිභෝගික ජාත්‍යන්තරය **(ලකුණු 01යි)**

(ආ) මාර්තු මස පහළොස්වන දින (මාර්තු 15) **(ලකුණු 01යි)**

33. (අ) සීමාසහිත සමාගමකට නෛතික පුද්ගලභාවය හිමිවනුයේ, සමාගම් පනතින් සහ .... මගිනි.

(ආ) ව්‍යාපාරයේ කටයුතුවලට ක්‍රියාකාරීව සහභාගී නොවන, එසේ ම හවුල්කරුවකු බව ප්‍රසිද්ධියේ හෙළි නොකරන හවුල්කරු ..... යන නමින් හඳුන්වනු ලබයි.

පිළිතුරු

(අ) සාංගමික ව්‍යවස්ථාවලිය **(ලකුණු 01යි)**

(ආ) අක්‍රීය / නිදන හවුල්කරු **(ලකුණු 01යි)**

34. (අ) පුද්ගලයකු ඔහුට ආවේණික වූ එක ම ආකාරයකට සිතීම, ව්‍යවසායකත්ව සංවර්ධනයට එරෙහි අභියෝගයකි. මෙම පුද්ගල ලක්ෂණය ..... ලෙස හඳුන්වනු ලබයි.

(ආ) ප්‍රියමනාප චරිත *(role models)*, පලපුරුද්ද, අධ්‍යාපනය, පවුල *(family)* යන සාධක අතුරින් පුද්ගල සාධක ලෙස පිළිගත හැක්කේ ..... පමණි.

පිළිතුරු

(අ) මනෝ විහිතිය (MINDSET) **(ලකුණු 01යි)**

(ආ) පළපුරුද්ද, අධ්‍යාපනය **(ලකුණු 01යි)**

35. (අ) ශ්‍රී ලංකාව තුළ ණය ශ්‍රේණිගත කිරීමෙහි ලා කටයුතු කරන ආයතන දෙක වනුයේ .... සහ ..... ය.

(ආ) අන්තර් බැංකු වෙක්පත් නිෂ්කාෂණ කටයුතු පවත්වා ගෙන යන ආයතනය වනුයේ .... ය.

පිළිතුරු

(අ) FITCH RATING LANKA (PVT) LTD., RAM RATING LANKA (PVT) LTD. **(ලකුණු 01යි)**

(ආ) පළපුරුද්ද, අධ්‍යාපනය **(ලකුණු 01යි)**

පිළිතුරු

(අ)



(ලකුණු 01යි)

(ආ) නානාංශ / උපාංශ වෙළෙඳසැල් **(ලකුණු 01යි)**

37. (අ) කිසියම් කළමනාකරුවකුට සෘජුව ම වාර්තා කරනු ලබන සහායකයින්ගේ සංඛ්‍යාව පිළිබඳ වූ සංකල්පය ..... ලෙස හඳුන්වයි.

(ආ) මෙහෙයවීමේ ක්‍රියාවලිය 1..... , 2. ..... සහ. 3..... යන ප්‍රධාන කොටස් තුනෙන් සමන්විත වේ.

පිළිතුරු

(අ) පාලන අවකාශය / කළමනාකරණ අවකාශය **(ලකුණු 01යි)**

(ආ) නායකත්වය, සන්නිවේදනය, අභිප්‍රේරණය **(ලකුණු 01යි)**

38.

ඉහත රූප සටහනින් නිරූපණය කෙරෙන නිෂ්පාදිත ජීවන චක්‍රයේ අදියර **හතර** වනුයේ

1. ..... 2. ..... 3. ..... 4..... ය.

පිළිතුරු

1. හඳුන්වාදීම 2. වර්ධනය 3. පරිනත 4. පිරිහෙන

(ලකුණු 02යි)

(අනුපිළිවෙල අවශ්‍ය වේ. දෙකක් හෝ තුනක් නම් ලකුණු 01යි)

39. (අ) හිමිකරු ප්‍රාග්ධනය සහ ණය ප්‍රාග්ධනය අතර පවත්නා සම්බන්ධතාව ..... ලෙස හඳුන්වයි.

(ආ) කොටස් වෙළෙඳපොළෙහි සමස්තයක් වශයෙන් කොටස් මිල ගණන් ඉහළ යමින් පවත්නා තත්ත්වයක් වෘෂභ වෙළෙඳපොළ *(Bull Market)* ලෙසත්, මිල ගණන් පහළ යමින් පවත්නා තත්ත්වයක් ..... වෙළෙඳපොළ ලෙසත් හැඳින්වේ.

පිළිතුරු

(අ) ප්‍රාග්ධන තෝලනය **(ලකුණු 01යි)**

(ආ) වලසා (Bear Market) **(ලකුණු 01යි)**

40. (අ) ආයතනයක කාර්යාලය ඉදිරිපිට ඇති දන්වීම් පුවරුවේ එම ආයතනයේ රැකියා තනතුරු කිහිපයක් සඳහා සුදුසු සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවීමේ දැන්වීමක් පළ කර තිබුණි. මෙම දැන්වීම ..... ලෙස හැඳින්වේ.

(ආ) කිසියම් කාල පරිච්ඡේදයක් තුළ සේවක යෙදවුම් හා නිමැවුම් අතර ඇති සම්බන්ධතාව ..... ලෙස හඳුන්වයි.

පිළිතුරු

(අ) අභ්‍යන්තර ආකර්ෂණය **(ලකුණු 01යි)**

(ආ) ශ්‍රම ඵලදායීතාව **(ලකුණු 01යි)**

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

41 පාරිභෝගික භාණ්ඩ වර්ග හතරකට බෙදිය හැකි ය. එම වර්ග **හතර** කවරේ ද?

1. ..... 2. .....

3. ..... 4. .....

පිළිතුරු

1. පහසු භාණ්ඩ 2. සාප්පු භාණ්ඩ 3. විශේෂිත භාණ්ඩ 4. නොසෙවූ භාණ්ඩ

(ලකුණු 02යි)
(දෙකක් හෝ තුනක් නම් ලකුණු 01යි)

42. ව්‍යාපාරයක ආසන්න පරිසර බලවේගවලින් **එකක්** ලෙස ගනුදෙනුකරුවන් යන්න දක්විය හැකි ය. සෙසු බලවේග **හතර** කවරේ ද?

1. ..... 2. .....

3. ..... 4. .....

1. සැපයුම්කරුවන් 2. තරගකරුවන්
3. ආදේශන භාණ්ඩ නිපදවන්නන් 4. විභව ආයෝජකයින්

(ලකුණු 02යි)
(දෙකක් හෝ තුනක් නම් ලකුණු 01යි)

43. (අ) ශ්‍රී ලංකාවෙන් පිටත පමණක් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ලියාපදිංචි කරනු ලබන සමාගම් හඳුන්වන්නේ කවර නමකින් ද?

.....

(ආ) ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරයේ ජාතික මට්ටමේ සංවිධානය හඳුන්වන්නේ කිනම් නමකින් ද?

.....

පිළිතුරු

(අ) අක්වෙරළ සමාගම් **(ලකුණු 01යි)**

(ආ) ශ්‍රී ලංකා ජාතික සමූපකාර මණ්ඩලය **(ලකුණු 01යි)**

44. පහත සඳහන් දෑ අතුරෙන් ව්‍යවසායකත්ව ගුණාංග ලෙස පිළිගත හැකි දෑ යටින් ඉරක් ඇඳ දක්වන්න.

- සන්නිවේදනය
- නිර්මාණශීලීත්වය
- නව සොයා ගැනීම්
- විශ්වාසය හා අගනාවන්
- ආත්ම විශ්වාසය
- නායකත්වය
- අවස්ථා සොයා යෑම
- කළමනාකරණය

පිළිතුරු

නිර්මාණශීලිත්වය, ආත්ම විශ්වාසය, නායකත්වය, අවස්ථා සොයා යෑම **(ලකුණු 02යි)**

(දෙකක් හෝ තුනක් නම් ලකුණු 01යි)

45. ණය පතකින් ගනුදෙනු කිරීමේ දී පාර්ශ්ව හතරක් සම්බන්ධ වේ. එම පාර්ශ්ව **ගතර** නම් කරන්න.

1. ..... 2. ..... 3. ..... 4.....

පිළිතුරු

1. ණයපත් හිමියා
2. ණයපත් නිකුත් කරන ආයතනය
3. වෙළෙඳ ආයතනය / විකුණුම්කරු
4. ණයපත් සංගමය

(ලකුණු 02යි)

(දෙකක් හෝ තුනක් නම් ලකුණු 01යි)

46. (අ) ශ්‍රී ලංකාවේ මෑතකදී විවෘත කළ (2013 මාර්තු) ජාත්‍යන්තර ගුවන් තොටුපළ කුමක් ද?
සැ.යු. - **ස්ථානයේ නම** සමග **සම්පූර්ණ නම** ලියන්න.

.....

(ආ) එය හැරුණු විට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක අනෙක් ජාත්‍යන්තර ගුවන් තොටුපළ කුමක් ද?
සැ.යු. - **ස්ථානයේ නම** සමග **සම්පූර්ණ නම** ලියන්න.

.....

පිළිතුරු

(අ) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල

හෝ

හම්බන්තොට රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල **(ලකුණු 01යි)**

(ආ) කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල

හෝ

කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල **(ලකුණු 01යි)**

47. (අ) කාර්යක්ෂමතාව මැනීමට භාවිත කළ හැකි මිනුම කුමක් ද?

.....

(ආ) ව්‍යාපාර ආයතනයක මුළු ස්ථාවර පිරිවැය රු. 40 000 කි. ඒකකයක විකුණුම් මිල රු. 80 කි. ඒකකයක විචල්‍ය පිරිවැය රු. 40 කි. මෙම ව්‍යාපාරයේ සමච්ඡේද නිෂ්පාදනය ඒකක කීය ද?

.....

පිළිතුරු

(අ) ඵලදායීතාව හෝ <u>නිමැවුම්</u> යෙදවුම් **(ලකුණු 01යි)**

(ආ) ඒකක 100 **(ලකුණු 01යි)**

48. වෙළෙඳපොළ බණ්ඩනයේ දී උපයෝගී කර ගන්නා සාධක පාරිභෝගික ගතිලක්ෂණ සහ පාරිභෝගික ප්‍රතිචාර අනුව කොටස් හතරකට බෙදිය හැකි ය. එම **හතර** කවරේ ද?

1. ..... 2. .....

3. ..... 4. .....

පිළිතුරු

1. භූගෝලීය පරිසරය 2. ප්‍රජා විද්‍යාත්මක සාධක
3. මනෝ විද්‍යාත්මක භාවය 4. චර්යාත්මක සාධක **(ලකුණු 02යි)**

(දෙකක් හෝ තුනක් නම් ලකුණු 01යි)

49. (අ) ආයෝජකයින්ට සමාගම්වල කොටස් මිලට ගත හැකි මාර්ග දෙකක් වේ. එම මාර්ග **දෙක** නම් කරන්න.

1. .....

2. .....

(ආ) සේවකයින් උසස් කිරීමේ දී උපයෝගී කර ගන්නා විධිමත් නිර්ණායක **දෙකක්** වේ. එම නිර්ණායක කවරේ ද?

1. .....

2. .....

පිළිතුරු

(අ) ප්‍රාථමික වෙළෙඳපොළ ද්විතියික වෙළෙඳපොළ **(ලකුණු 01යි)**

(පිළිතුරු දෙකම අවශ්‍යය)

(ආ) 1. ජ්‍යෙෂ්ඨත්වය 2. කුසලතාවය **(ලකුණු 01යි)**

50. (අ) අන්තර්ජාලය තුළ තොරතුරු සෙවීමේ දී බහුලව යොදා ගන්නා සෙවුම් යන්ත්‍ර **දෙකක්** නම් කරන්න.

1. ..... 2. .....

(ආ) තොරතුරු පද්ධති භාවිත කළ හැකි මට්ටම් හතරක් වේ. එම මට්ටම් **හතර** නම් කරන්න.

1. .....

2. .....

3. .....

4. .....

පිළිතුරු

(අ) 1. yahoo 2. Google **(ලකුණු 01යි)**

(ආ) 1. මෙහෙයුම් මට්ටම 2. දැනුම් මට්ටම
3. කළමනාකරණ මට්ටම 4. උපක්‍රමික මට්ටම **(ලකුණු 01යි)**

2.1.8 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ



2.1.9 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබා ඇති ආකාරය

ප්‍රශ්න අංකය	ලකුණු ලබාගත් ප්‍රතිශතය			
	ලකුණු 0	ලකුණු 1	ලකුණු 2	ප්‍රතිචාර නොදැක්වූ
31	25%	36%	38%	1%
32	46%	35%	17%	2%
33	42%	48%	8%	2%
34	48%	42%	9%	1%
35	46%	32%	20%	2%
36	2%	60%	38%	-
37	41%	24%	32%	3%
38	40%	24%	33%	3%
39	45%	33%	18%	4%
40	32%	56%	10%	2%
41	9%	16%	74%	1%
42	30%	48%	21%	1%
43	16%	69%	14%	1%
44	78%	13%	7%	2%
45	38%	38%	22%	2%
46	24%	35%	40%	1%
47	26%	40%	32%	2%
48	72%	11%	11%	6%
49	70%	21%	6%	3%
50	22%	53%	24%	1%

වගුව 07

* I පත්‍රයේ ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්නවලට ලකුණු ලබාගත් ප්‍රතිශතය ලකුණු 0, ලකුණු 01, ලකුණු 02 තීරුවලින් දැක්වේ.

* ''ප්‍රතිචාර නොදැක්වූ'' යනුවෙන් දක්වා ඇත්තේ ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා නොමැති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතයයි.

  උදා :- 44 වන ප්‍රශ්නයට ලකුණු 0 ලබාගෙන ඇති ප්‍රතිශතය 78%කි. ප්‍රශ්න අංක 36ට ලකුණු 0 ලබා ගෙන ඇති ප්‍රතිශතය 2%කි. අයදුම්කරුවන්ගෙන් 74%ක් ප්‍රශ්න අංක 41 සඳහා ලකුණු 02ම ලබාගෙන ඇති අතර, අයදුම්කරුවන්ගෙන් අඩු ම ප්‍රතිශතයක් එනම් 6%ක් ලකුණු 02ම ලබාගෙන ඇති ප්‍රශ්නය වන්නේ ප්‍රශ්න අංක 49 වේ.

2.1.10 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා :

1 ප්‍රශ්න පත්‍රයේ 31-40 දක්වා වූ සුදුසු වචන යොදා හිස්තැන් පිරවීමේ ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී සිසුන් වැඩි පිරිසක් සාර්ථකව පිළිතුරු සපයා ඇත්තේ 41, 36, 46 හා 31 යන ප්‍රශ්න සඳහා ය. ඒවායේ පහසුතාව පිළිවෙළින් ප්‍රතිශතයක් ලෙස 82%, 68%, 58% හා 55%% වේ.

මෙම කොටසට අදාළව අසාර්ථක ලෙස පිළිතුරු සපයා ඇත්තේ 44, 48, 49, 33, 34 හා 39 යන ප්‍රශ්න සඳහාය. ඒවායේ පහසුතා මට්ටම් ප්‍රතිශතය ලෙස 13%, 16%, 17%, 30%, 33% හා 34% වේ.

ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර සම්බන්ධ 44 වන ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබාගත් ප්‍රතිශකය 7% කි. කිසිදු ලකුණක් නොලැබූ අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 78% කි. මෙම ප්‍රශ්නයට අසාර්ථක පිළිතුරු ලැබීමට හේතු වී ඇත්තේ ව්‍යවසායකත්ව ගුණාංග හා කුසලතා පිළිබඳව වෙනස්කම් නිවැරදිව හඳුනාගෙන නොමැති වීම නිසා බව පෙනේ. මෙම සංකල්ප පිළිබඳ දැනුම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ වැඩි අවධානයක් යොමු කළ යුතු යි.

අලෙවි කළමනාකරණය හා සම්බන්ධ 48 වන ප්‍රශ්නයේ දී සම්පූර්ණ ලකුණු ලබා ගෙන තිබුණේ 11%ක ප්‍රතිශතයකි. කිසිදු ලකුණක් ලබා නොගත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 72% කි. වෙළෙඳපොළ බණ්ඩනය කිරීමේ පදනම් පිළිබඳව පුළුල් අවබෝධයක් සිසුන්ට නොමැති බව මෙහි දී පෙනේ. මේ නිසා වෙළෙඳපොළ බණ්ඩනයේ පදනම් පිළිබඳව සිසුන්ගේ අවබෝධය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය.

මූල්‍ය කළමනාකරණය හා සම්බන්ධ 49 වන ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබා ගත් ප්‍රතිශතය 6% කි. කිසිදු ලකුණක් නොලැබූ ප්‍රතිශතය 70% කි. මෙම ප්‍රශ්නයේ ''අ'' කොටසට අදාළව අයදුම්කරුවන් වැඩි පිරිසක් සාපේක්ෂව සාර්ථකව පිළිතුරු ලබා දී තිබුණ ද, මානව සම්පත් කළමනාකරණය හා සම්බන්ධ ''ආ'' කොටසට පිළිතුරු සැපයීමේ දී ප්‍රධාන නිර්ණායක දෙක අවබෝධකර ගෙන නොතිබීම පහසුතාව පහළ යාමට හේතු වී ඇති බව පෙනේ. සේවකයන් උසස් කිරීමේ දී යොදා ගන්නා නිර්ණායක පිළිබඳ ව අයදුම්කරුවන්ට නිවැරදි අවබෝධයක් ලබා දිය යුතු ය.

ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර සම්බන්ධ 34 වන ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබාගත් ප්‍රතිශතය 9% කි. කිසිදු ලකුණක් ලබා නොගත් ප්‍රතිශතය 48% කි. පිළිතුරු අසාර්ථකවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ, ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර නොගැනීම බව පෙනේ. 34 ''අ'' කොටසට නිශ්චිත පිළිතුර අපේක්ෂා කරන අතර ''ආ'' කොටසේ දී පුද්ගල සාධක දෙකම අපේක්ෂා කෙරේ. එහෙත් අයදුම්කරුවන් වැඩිදෙනෙකු එක් සාධකයක් පමණක් දක්වා තිබීම පහසුතාව පහළ යාමට හේතු වී ඇති බව පෙනේ.

මූල්‍ය කළමනාකරණය හා සම්බන්ධ 39 වන ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබා ගත් ප්‍රතිශතය වනුයේ 18% කි. කිසිදු ලකුණක් ලබා නොගත් ප්‍රතිශතය 45% කි. මෙහි දී ''අ'' කොටසට වැඩි සාර්ථකත්වයක් දක්නට ලැබුණ ද, ''ආ'' කොටස සඳහා අඩු සාධන මට්ටමක් පෙන්නුම් කර ඇත. කොටස් වෙළෙඳපොළ පිළිබඳව සිසුන්ගේ යාවත්කාලීන අවබෝධය නොමැතිවීම මෙම අසාර්ථකත්වයට හේතු වී ඇති බව පෙනේ. කොටස් වෙළෙඳපොළ පිළිබඳව ප්‍රායෝගික දැනුම වැඩි කිරීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සම්මන්ත්‍රණ, ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම වැනි ක්‍රම අනුගමනය කිරීම වඩාත් ඵලදායී වනු ඇත.

1 ප්‍රශ්න පත්‍රයේ 31 සිට 50 දක්වා ප්‍රශ්නවලට අදාළව පිළිතුරු සැපයීමේ දී ප්‍රශ්න හොඳින් කියවා හරය තේරුම් ගෙන කෙටි නිශ්චිත පිළිතුරු සැපයීමට සිසුන් පුරුදු පුහුණු කළ යුතු ය. පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මේ සම්බන්ධව වැඩි අවධානයක් යොමු කළ යුතු යි.

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

කාලය පැය 03 කි. මුළු ලකුණු 100 කි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය.

I කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි.

II කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි.

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සැපයිය යුතුය.

* එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100කි.

* ප්‍රශ්න පත්‍ර දෙක සඳහා අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රය සඳහා ලකුණු	=	100
II පත්‍රය සඳහා ලකුණ	=	100
අවසාන ලකුණු	=	200 ÷ 2
	=	100

2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2, 3, 4.1 හා 4.2 ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.

II පත්‍රය

1 ප්‍රශ්නය

I කොටස

1. (i) **වුඩ් මාස්ටර්** *(Wood Master)* පුළුල් පරාසයක ලී බඩු උපකරණ නිපදවන ව්‍යාපාරයකි. මෙම ආයතනය නිවෙස්වලට හා කාර්යාලවලට අවශ්‍ය විවිධ ආකාරයේ ලී බඩු නිෂ්පාදනය කරයි.
   (අ) "වුඩ් මාස්ටර්" ව්‍යාපාරය යොදා ගනු ඇතැයි සිතිය හැකි, භූමිය, ශ්‍රමය හා ප්‍රාග්ධනය යන සම්පත් සඳහා නිදසුනක් බැගින් දක්වන්න.
   (ආ) "වුඩ් මාස්ටර්" ව්‍යාපාරය නිපදවන භාණ්ඩ පාරිභෝගික භාණ්ඩ සහ ප්‍රාග්ධන භාණ්ඩ (ව්‍යාපාරික භාණ්ඩ) වශයෙන් වර්ග කළ හැකි ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(ii) ව්‍යාපාර කටයුතු හා සම්බන්ධ කාර්යයන් **හයක්** සඳහන් කර, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(iii) වර්තමානයේ සමහර ව්‍යාපාර "කොටස්කරු සංකල්පයෙන්" *(Shareholders Concept)* ඉවත් වී ඇල්මැති පාර්ශ්ව සංකල්පයට *(Stakeholders Concept)* අවතීර්ණ වන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(iv) නූතන ව්‍යාපාරවල දකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ, කාර්ය විශේෂීකරණයයි. කාර්ය විශේෂීකරණයේ හිතකර ප්‍රතිඵල **දෙකක්** හා අහිතකර ප්‍රතිඵල **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(v) ඔබ දන්නා ව්‍යාපාර ආයතනයක් උදහරණයට ගෙන, එම ආයතනය සමාජ වගකීම් සංකල්පයට කෙසේ දායක වන්නේ දැ'යි පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(මුළු ලකුණු 20 යි)

1. (i) (අ) භූමිය = දැව / වන
කර්මාන්තශාලා පරිශ්‍රය / ඉඩම **(උදා: 1 ට ලකුණු 1/2යි)**

ශ්‍රමය = වඩු කාර්මික /සේවකයන්
සුපරීක්ෂක / කළමණාකරුවන්
(උදා: 1 ට ලකුණු 1/2යි)

ප්‍රාග්ධනය = යන්ත්‍ර සූත්‍ර / ගොඩනැගිලි
මුදල් **(උදා: 1 ට ලකුණු 1/2යි)**

(ආ) ඔව් / හැකිය. **(ලකුණු 1/2යි)**
පාරිභෝගික භාණ්ඩ - නිවෙස්වලට අවශ්‍ය ලී බඩු **(ලකුණු 01යි)**
කාර්මික භාණ්ඩ - කාර්යාලවලට අවශ්‍ය ලී බඩු **(ලකුණු 01යි)**

(ii)
- මෙහෙයුම්
- අළෙවිකරණය
- මූල්‍ය
- මානව සම්පත්
- පර්යේෂණ හා සංවර්ධන
- පරිපාලනය

කාර්යයන් 6 ම නම්කර පැහැදිලි කිරීමට (ලකුණු 04යි)
කාර්යයන් 5 ක් පමණක් නම්කර පැහැදිලි කිරීමට (ලකුණු 03යි)
කාර්යයන් 4 ක් පමණක් නම්කර පැහැදිලි කිරීමට (ලකුණු 02යි)
කාර්යයන් 3 ක් පමණක් නම්කර පැහැදිලි කිරීමට (ලකුණු 01යි)
කාර්යයන් 1 හා දෙකකට 2 කට (ලකුණු 00යි)

(iii) කොටස්කරු සංකල්පය යනු කොටස්කරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි ධනය උපරිම කිරීම කෙරෙහි පමණක් අවධානය යොමු කිරීමයි. ඇල්මැති පාර්ශව සංකල්පය යනු ව්‍යාපාරයට ඇල්මක් දක්වන සියලුම පාර්ශවයන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම කෙරෙහි සැලකිල්ල යොමු කිරීමයි. වර්තමානයේ කොටස් කරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි ධනය උපරිම කිරීම පමණක් නොව සියලුම ඇල්මැති පාර්ශවයන්ගේ අපේක්ෂා ඉටුකරදීම තුලින් ව්‍යාපාරය වඩා සාර්ථක කරගත හැකි බව කළමනාකරුවෝ විශ්වාස කරති. ඇල්මැති පාර්ශවයන් ලෙස පාර්ශවයන් 4 ක් වත් සඳහන් විය යුතුයි.

කොටස්කරු සංකල්පය හඳුනා ගැනීමට (ලකුණු 01යි)
ඇල්මැති පාර්ශව සංකල්ප හඳුනා ගැනීමට (ලකුණු 01යි)
ඇල්මැති පාර්ශව සංකල්පයට අවතීර්න වීමට හේතුව පැහැදිලි කිරීමට (ලකුණු 02යි)

(iv) හිතකර ප්‍රතිඵල :-

- කාර්ය පිළිබඳව විශේෂඥතාවයක් ඇතිවීම
- කාලය ඉතිරිවීම
- ඵලදායීතාවය වැඩිවීම
- කාර්යක්ෂමතාවය ඉහළ යාම
- අපතේ යාම් අඩුවීම
- කළමනාකරණය පහසුවීම
- වෙනත්

(කරුණු 2 ට ලකුණු 02යි)

අහිතකර ප්‍රතිඵල :-

- කාර්ය නීරස වීම
- එක් සේවකයෙකුගේ හෝ කණ්ඩායමක පමාව නිසා මුළු නිෂ්පාදනයම අඩාලවීම
- අධි විශේෂිකරණය නිසා සේවක චලනය අපහසුවීම
- සේවක ප්‍රවාසිතාවය / ශ්‍රම පිරිවැටුම ඉහළ යාම
- වෙනත්

(කරුණු 2 ට ලකුණු 02යි)

(v) ආයතනයක් නම් කිරීමට **(ලකුණු 01යි)**

එම ආයතනය සමාජ වගකීමට දායකවන ආකාරය පැහැදිලි කිරීමට

උදා : පාසල් සඳහා අනුග්‍රාහකත්වය
ආරෝග්‍ය ශාලා වැඩි දියුණු කිරීම
මංමාවත් සංවර්ධනය කිරීම
ක්‍රීඩා උපකරණ සැපයීම
පරිසර සංරක්ෂණ කටයුතු

ඕනෑම පාර්ශවයකට අදාළව කරුණු 03 ක් පැහැදිලි කිරීමට (ලකුණු 03යි)
(සේවක, ආයෝජක, සමාජය, ගණුදෙනුකරු)

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



II ප්‍රශ්න පත්‍රයෙහි I කොටසින් වැඩිම සිසුන් පිරිසක් තෝරාගත් ප්‍රශ්නය මෙයයි. 1 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 98%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 9%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 23%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 63%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 37%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් කොටස් සහ අනුකොටස් 06 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (i) (අ) වන අතර එහි පහසුතාව 87%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (iii) වන අතර එහි පහසුතාව 40%ක් බවත් සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතා මෙම ප්‍රස්තාරයෙන් පැහැදිලි වේ.

(i) අනු කොටසෙහි ''ආ'' සඳහා පහසුතාව 48%කි. මෙම කොටසෙහි පාරිභෝගික භාණ්ඩ හා ප්‍රාග්ධන භාණ්ඩ / කාර්මික භාණ්ඩ අතර වෙනස අයදුම්කරුවන් විසින් අවබෝධ කරගෙන ඇති බව නොපෙනේ. එම නිසා පහසුතාව පහළ ගොස් ඇත. කිසියම් සිද්ධියක් ආශ්‍රයෙන් අසනු ලබන ප්‍රශ්න සඳහා අවබෝධයෙන් යුතුව පිළිතුරු සැපයීමට සිසුන්ට මඟ පෙන්විය යුතුය.

(ii) අනු කොටසෙහි පහසුතාව 43%කි. මෙහි දී ව්‍යාපාර කටයුතු හා සම්බන්ධ කාර්යයන් නම් කර තිබුණ ද, ඒවා පැහැදිලි කර නොතිබුණි. පැහැදිලි කිරීම් අවශ්‍ය තැන්වලදී ඒවා සාර්ථකව ඉදිරිපත් කිරීමට හැකියාව ලැබෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කරවිය යුතුය.

(iii) අනු කොටසෙහි පහසුතාව 40%කි. ව්‍යාපාරයක් හා සම්බන්ධ වන ඇල්මැති පාර්ශවයන්ගේ නව ප්‍රවණතාවයක් වූ කොටස්කරු සංකල්පයෙන් ඔබ්බට ගිය ඇල්මැති පාර්ශවයන් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් අයදුම්කරුවන් තුළ නොතිබුණු බව පෙනේ. ඇල්මැති පාර්ශවයන්ගේ නව ප්‍රවණතා පිළිබඳ සිසුන්ට පුළුල් අවබෝධයක් ලබා දිය යුතු යි.

(v) අනු කොටසෙහි පහසුතාව 62%කි. මෙයට හේතුව මෙම ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර නොගෙන පිළිතුරු සපයා තිබීමය. සෘජුව වගකීම් පිළිබඳව දැනුම, අවබෝධය සිසුන් තුළ පැවතුන ද, එය ප්‍රායෝගිකව භාවිතය හා විශ්ලේෂණයට ඔවුන් තුළ හැකියාවක් නොතිබුණු බව පෙනේ. එම නිසා මෙම සංකල්ප හැකිතාක් ප්‍රායෝගික භාවිතය තුළින් අවබෝධ කරවීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතු යි.

2 ප්‍රශ්නය

2. (i) ශ්‍රී ලංකා රජය මෙරට ව්‍යාපාර ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා බලපෑම් කරන ආකාර **හතරක්** කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 04 යි)*

(ii) (අ) ප්‍රමිතියක් යනු කුමක් ද?

(ආ) ජාතික ප්‍රමිති පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තුළින් රටකට අත්වන ප්‍රතිලාභ කවරේදැයි පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(iii) සිය පියා විසින් දිගු කලක් තිස්සේ පවත්වාගෙන එනු ලැබූ ආපනශාලාවක් *(Restaurant)* රසිකා විසින් බාර ගන්නා ලදී. ඇය එම ව්‍යාපාරය යම් යම් නවීකරණවලට භාජනය කළ අතර පළතුරු යුෂ අලෙවි කිරීමේ අංශයක් ද විවෘත කළා ය. ඒ අනුව ආපනශාලාවේ පිරිවැටුම වැඩි වී ලාභය ද ඉහළ ගියේ ය. නමුත් රසිකාගේ විනෝදාත්මක කටයුතු නිසා ආපනශාලාවේ සුපරීක්ෂණය ක්‍රමයෙන් අඩු විය. එහි ප්‍රතිඵලය වූයේ ටික කලකින් මූල්‍ය දුෂ්කරතා පැන නැගී ව්‍යාපාරය බංකොලොත් වීමයි.

(අ) රසිකාගේ මෙම ව්‍යාපාරයේ නිමැවුම භාණ්ඩයක් ද? සේවාවක් ද?

(ආ) ඔබේ පිළිතුර අනුව එම භාණ්ඩයේ හෝ සේවාවේ ඔබ දකින විශේෂත්වය කුමක් ද? පැහැදිලි කරන්න.

(ඇ) මෙහි සඳහන් විස්තරය අනුව රසිකාගේ ව්‍යාපාරයේ සංවිධාන ක්‍රමය කුමක් ද?

(ඈ) රසිකාගේ මෙම ව්‍යාපාරය නිදසුනකට ගනිමින් 'අසීමිත වගකීම් සංකල්පයේ' අදහස පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(iv) ආතර්, බර්ටි, වාල්ස් ගිණුම්කරණය සහ බදු සේවා සැපයීමේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ගණකාධිකාරීන් තිදෙනෙකි. ගිණුම්කරණය සහ බදු සේවාවන්හි වෙන් වෙන් වූ අංශ පිළිබඳ විශේෂඥතා ඔවුහු සතු වූහ. ආරම්භක ප්‍රාග්ධනය සම සමව සැපයූ අතර, ලේකම්වරියක් හා ලිපිකරුවන් කිහිප දෙනෙක් ඔවුන් යටතේ සේවය කළහ. ඉතා සාර්ථකව ව්‍යාපාරය පවත්වාගෙන ගිය ද ටික කලකින් ඔවුන් අතර ඇති වූ මතභේදයක් නිසා බර්ටි හවුල් ව්‍යාපාරයෙන් ඉවත් වීමට තීරණය කළේ ය. ඒ අනුව හවුල විසුරුවාලීමට තීරණය කෙරිණි. එහෙත් ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් කෙසේ බෙදා ගත්තවා ද යන්න ඔවුනට ගැටලුවක් විය.

(අ) මෙම සිද්ධියේ සඳහන් වන පරිදි බොහොමයක් හවුල් ව්‍යාපාර සේවා සැපයීමේ කටයුතුවල නිරත වේ. හවුල් ව්‍යාපාර එසේ සේවා සැපයුම් අංශයේ නිරත වන්නේ ඇයි දැ'යි පෙන්වා දෙන්න.

(ආ) මොවුන්ගේ හවුල් ව්‍යාපාරය මේ අයුරින් අසාර්ථක වීම වළක්වා ගැනීමට ව්‍යාපාරය ආරම්භයේ දී ම කුමක් කළ යුතුව තිබුණේ දැ'යි පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(v) (අ) 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව සීමාසහිත පොදු සමාගමක සාමාන්‍ය කොටස් මිලට ගත් ආයෝජකයකුට හිමි වන අයිතිවාසිකම් කවරේ ද?

(ආ) සීමාසහිත සමාගමක් සංස්ථාගත කිරීමට අවශ්‍ය ලේඛන අතුරෙන් සාංගමික ව්‍යවස්ථාවලියට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. සමාගමේ කටයුතු සඳහා සාංගමික ව්‍යවස්ථාවලිය කෙසේ බලපාන්නේ දැ'යි පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(මුළු ලකුණු 20 යි),

2. (i) 1. යටිතල පහසුකම් සපයන්නෙකු ලෙස
2. ප්‍රතිපත්ති සම්පාදකයෙකු ලෙස
3. නියාමකයෙකු ලෙස
4. තරගකරුවෙකු ලෙස
5. ගනුදෙනුකරුවෙකු ලෙස
6. දිරිගැන්වීම් සපයන්නෙකු ලෙස
7. බදු අයකරන්නෙකු ලෙස

(ඕනෑම කරුණු 04ක් පැහැදිලි කිරීම සඳහා ලකුණු 04යි)

(ii) (අ) නිෂ්පාදනයෙහි, වෙළෙඳාමෙහි, පරිභෝජනයෙහි උපරිම කාර්යක්ෂමතාවය සඳහා විද්‍යාවේ, තාක්ෂණයේ හා පළපුරුද්දේ ප්‍රතිඵල එක්කර අදාළ සියලු අංශවල සහයෝගයෙන් හා එකඟතාවයෙන් පිළියෙල කර, අන්තර්ජාතික, කලාපීය හා ජාතික මට්ටමේ පිළිගත් ආයතනයක් මගින් අනුමත කර මහජනයා වෙත නිකුත් කරනු ලබන තාක්ෂණික පිරිවිතරයකි.

(මෙම අදහස පැහැදිලි කර ඇත්නම් ලකුණු 02යි)

(iii) (අ) සේවාවකි **(ලකුණු 01යි)**

(ආ) ★ <u>සේවාවේ ගති ලක්ෂණ</u>

(i) ගබඩා කළ නොහැකි වීම

(ii) නිෂ්පාදනය හා පරිභෝජනය එකවිට සිදු වීම

(iii) නිෂ්පාදකයාගෙන් වෙන්කළ නොහැකි වීම

(iv) අස්පෘශ්‍ය වීම

(ගති ලක්ෂණ 04ක් විස්තර කිරීමට ලකුණු 01යි)

හෝ

★ <u>භාණ්ඩයක ගති ලක්ෂණ</u>

(i) ස්පර්ශ කළ හැකි වීම

(ii) නිෂ්පාදකයාගෙන් වෙන් කළ හැකි වීම

(iii) ගබඩා කළ හැකි වීම

(iv) නිෂ්පාදනය හා පරිභෝජනය එකවර සිදු නොවීම

(ගති ලක්ෂණ 04ක් විස්තර කිරීමට ලකුණු 01යි)

හෝ

★ <u>7p (අලෙවි මිශ්‍රය)</u> සඳහන් කර ඇත්නම් එනම්,

(i) නිෂ්පාදිතය

(ii) මිල

(iii) ස්ථානය

(iv) ප්‍රවර්ධනය

(v) ක්‍රියාවලිය

(vi) භෞතික පරිසරය

(vii) වෙළෙඳ සේවකයින් **(විස්තර කිරීමට ලකුණු 01යි)**

(ඇ) කේවල ස්වාමි ව්‍යාපාරයකි **(ලකුණු 01යි)**

(ඈ) ව්‍යාපාරයේ බාහිර වගකීම් සම්බන්ධයෙන් තම පෞද්ගලික දේපල පවා කැප කිරීමට සිදුවීම **(ලකුණු 01යි)**

(iv) (අ) හවුල්කරුවන්ගේ විවිධ දක්ෂතා ව්‍යාපාර කටයුතු සඳහා යොදාගත හැකිවීම **(ලකුණු 02යි)**

(ආ) ලිඛිත ගිවිසුමකට අනුව ආරම්භකළ යුතු ව තිබිණි **(ලකුණු 01යි)**

(v) (අ) i. ලාභාංශ ලැබීම
ii. ඡන්ද බලය
iii. ඈවර කිරීමේ දී අතිරික්ත වත්කම්වලට හිමිකම් පෑම **(කරුණු 02ට ලකුණු 02යි)**

(ආ) සමාගම හා එහි කොටස්හිමියන් අතර ඇති සම්බන්ධතාව දැක්වෙන ලියවිල්ල සාංගමික ව්‍යවස්ථාවලිය වේ.

මෙහි - සමාගමේ පරමාර්ථ
කොටස්හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම් හා
සමාගමේ කළමනාකරණය හා පරිපාලන කටයුතු යනාදිය මෙහි සඳහන් වේ.

(සම්බන්ධය පැහැදිලි කිරීමට ලකුණු 01යි)

2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



2 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 76%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 16%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 52%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 48%ක්ම ලබා ගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 11 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (iii) (ඇ) වන අතර එහි පහසුතාව 84%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (iii) (ආ) වන අතර එහි පහසුතාව 25%කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාව පිළිබඳ තොරතුරු මෙම ප්‍රස්තාරයෙන් පැහැදිලි වේ.

(ii) අනු කොටසෙහි ''අ'' පහසුතාවය 29%කි. ප්‍රමිතියක් යන්න නිශ්චිතව නිර්වචනය කිරීමට අයදුම්කරුවන් අපොහොසත් වී ඇති බව පෙනේ. විවධ සංකල්ප පිළිබඳ නිර්වචන නිවැරදිව ඉදිරිපත් කිරීමට සිසුන් දැනුවත් කිරීම තුළින් මෙම ගැටලුව මඟහරවා ගත හැකිය.

(iii) අනු කොටසෙහි ''ආ'' පහසුතාවය 25%කි. මෙම ප්‍රශ්නයේ පහසුතාව අඩු වීමට හේතු වී ඇත්තේ සේවාවේ විශේෂත්වය අයදුම්කරුවන් හට හඳුනා ගැනීමට නොහැකි වීමය. ඒ අනුව භාණ්ඩ හා සේවා අතර සංකල්පීය වෙනස්කම් සිද්ධි අධ්‍යයනය තුළින් පැහැදිලි කර දීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය යොදා ගත යුතු යි.

(iv) අනු කොටසෙහි ''අ'' ප්‍රශ්නයෙහි පහසුතාවය 37%කි. මෙහි පහසුතාව පහළ යාමට හේතුව වන්නේ සිද්ධියක් ඇසුරෙන් අසන ලද ප්‍රශ්නයේ හරය අවබෝධ කර නොගෙන පිළිතුරු ලිවීමයි. එම නිසා සිද්ධියක් මැනවින් අධ්‍යයනය කොට, අවබෝධ කරගෙන පිළිතුරු ලිවීමට අයදුම්කරුවන් වැඩි වශයෙන් පුරුදු පුහුණු කළ යුතු යි. සිද්ධිය ආශ්‍රයෙන්ම ප්‍රශ්න ගොඩ නැඟීමටත්, හැකිතාක් පිළිතුරු සිද්ධිය තුළට සීමා කිරීමටත් වග බලා ගත යුතු ය.

(iv) අනු කොටසෙහි ''ආ'' පහසුතාවය 52%කි. මෙයට හේතුව වනුයේ සිද්ධි අධ්‍යයනය තුළින් ප්‍රශ්න වලට පිළිතුරු ලිවීමට අයදුම්කරුවන් අපොහොසත් වීමය.

(v) අනු කොටසෙහි ''ආ'' පහසුතාවය 32%කි. මෙවැනි පහළ පහසුතා මට්ටමක් ලබා ගැනීමට බලපා ඇත්තේ ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගැනීමට අපොහොසත් වීමය. සමාගමක සාංගමික ව්‍යවස්ථාවලිය හුදෙක් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක් පමණක් නොව එය සමාගමේ එදිනෙදා ක්‍රියාකාරිත්වයට හා පැවැත්මට බලපාන ආකාරය පිළිබඳව සිසුන් දැනුවත් කිරීම සිදු කළ යුතු ය.

3 ප්‍රශ්නය

3. (i) සාමාන්‍ය ව්‍යාපාරිකයකුට වඩා කෙබඳු වෙනසක් ව්‍යවසායකයකු තුළ ඔබ දකින්නේ ද? *(ලකුණු 04 යි)*

(ii) බොහෝ රටවල රජයන් කුඩා ව්‍යාපාර ඒකක සංවර්ධනය උනන්දු කරවීමට විශේෂ කැමැත්තක් දක්වයි. මෙයට හේතු කවරේ දැ'යි ශ්‍රී ලංකාවේ ආර්ථිකය ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(iii) මෑතක දී විශ්‍රාම ගිය ඔබේ ඥාතියකුට සේවක අර්ථසාධක අරමුදලින් රුපියල් මිලියන තුනක් ලැබී ඇතැ'යි සිතන්න. එම මුදල මූල්‍ය සමාගමක ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට ඔහුට අවශ්‍යව ඇත. සුදුසු මූල්‍ය සමාගමක් තෝරා ගැනීමට ඔබ ඔහුට දෙන උපදෙස් කවරේ ද? *(ලකුණු 04 යි)*

(iv) (අ) "A" ගේ නමට ලැබුණු විධාන චෙක්පතක් "B" විසින් සොරකම් කර, "A" ගේ අත්සන හා පිටසන වංචනික ලෙස යොදා "C" ට පවරා එහි වටිනාකම් ලබා ගෙන ඇත. "C" එම චෙක්පත භාරගන්නා ලද්දේ සද්භාවයෙනි. මෙම චෙක්පතට හිමිකමක් "C" ට තිබේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) චෙක්පත රේඛනය කළ හැකි පාර්ශ්ව නම් කරන්න. *(ලකුණු 04 යි)*

(v) (අ) ගනුදෙනු සඳහා ව්‍යවහාර මුදල් හා චෙක්පත් භාවිතය ක්‍රමයෙන් අඩු වෙමින් පවතින අතර විද්‍යුත් මුදල් භාවිතය වැඩි වී ඇත. මෙසේ විද්‍යුත් මුදල් භාවිතය වැඩි වීමට හේතු කවරේ ද?

(ආ) හරපත *(Debit Card)* සහ ණයපත *(Credit Card)* අතර පවත්නා සමාන හා අසමානතා කවරේ ද? *(ලකුණු 04 යි)*

(මුළු ලකුණු 20 යි)

3. (i) සාමාන්‍ය ව්‍යාපාරිකයෙකුට වඩා ව්‍යවසායකයෙකු ගේ පහත සඳහන් විශේෂ ලක්ෂණ දැකිය හැකි ය.

1. දැක්මක් සහිත වීම
2. නිර්මාණශීලිත්වය (පරිකල්පනික චින්තනයක් සහිත වීම)
3. ධනාත්මක චින්තනයක් සහිත වීම
4. සුභවාදී වීම
5. අවස්ථා හඳුනා ගැනීම
6. අවදානම්වලට මුහුණ දීම
7. ආත්ම විශ්වාසය
8. වෙනත් පිළිගත හැකි කරුණු

(මෙම කරුණු 04ක් පැහැදිලිකර ඇති පිළිතුරට ලකුණු 04යි)

(ii)

1. කුඩා ව්‍යාපාර ශ්‍රම සූක්ෂම නිසා රැකියා අවස්ථා සැපයීම
2. ප්‍රාදේශීය සම්පත් භාවිතය නිසා ප්‍රාදේශීය සංවර්ධනය
3. අඩු ප්‍රාග්ධනයකින් ආරම්භ කළ හැකි වීම නිසා පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
4. ප්‍රාදේශීය සංවර්ධනය නිසා නගරයට ඇදී එන ජනතාව අඩු වීම
5. ආදායම් ව්‍යාප්ති විෂමතාව අවම වීම
6. හොඳ ව්‍යවසායකයින් බිහිවීම
7. මහා පරිමාණ ව්‍යාපාරවල පැවැත්ම සඳහා සේවාවන් හා සම්පත් සැපයීම
8. වෙළෙඳපොළ තුළ පවතින හිඩැස් පිරවීම සඳහා

(කරුණු 04කට ලකුණු 04යි)

(iii)

1. මහ බැංකුවේ ලියාපදිංචි කරන ලද මූල්‍ය සමාගමක් ද යන්න
2. ණය ශ්‍රේණිගත කිරීම / මූල්‍ය ස්ථාවරත්වය
3. ගෙවනු ලබන පොළිය
4. සමාගමේ අතීත මූල්‍ය තොරතුරු
5. සමාගමේ ඉතිහාසය
6. අධ්‍යක්ෂවරු හා කළමනාකරණය

(කරුණු 04කට ලකුණු 04යි)

(iv) (අ) නැත. **(ලකුණු 01යි)**

''සොරකම් කළ චෙක්පතක් නිසා මෙම චෙක්පත සම්බන්ධයෙන් ''C'' ට නීත්‍යානුකූල හිමිකමක් නොමැත. **(ලකුණු 01යි)**

(ආ) අණකරු
අණලදු
ආදායකයා **(ලකුණු 02යි)**

(v) (අ) i. භාවිතයේ පහසුව
ii. ආරක්ෂාකාරී වීම
iii. ඉහළ පිළිගැනීම
iv. නිශ්චිත කාලයකට පොළී රහිත ණයක් වීම (ණයපත්)
v. වෙනත් ප්‍රතිලාභ හිමිවීම **(කරුණු 04ට 1/2 බැගින් ලකුණු 02යි)**

(ආ) 1. විද්‍යුත් මුදල් වීම
2. මූල්‍යායතන විසින් නිකුත් කිරීම
3. භාණ්ඩ ලබා ගැනීම සඳහා භාවිත කළ හැකි වීම
4. ආරක්ෂාකාරී වීම **(සමානතා 02ක් සඳහා ලකුණු 01යි)**

අසමානතා :

හරපත	**ණයපත**
1. ගිණුමක් අවශ්‍ය වේ.	1. ගිණුමක් අවශ්‍ය නැත.
2. ගනුදෙනුවක දී ගිණුම හර වේ.	2. ගනුදෙනුවක දී ගිණුම බැර වේ.
3. ගිණුමේ මුදල් තිබිය යුතු ය.	3. ගිණුමේ මුදල් අවශ්‍ය නැත.
4. පොළියක් නැත.	4. පොළියක් අය කරයි.

(අසමානතා 02ක් සඳහා ලකුණු 01යි)

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



3 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 71%කි. (ප්‍රස්තාරය 02). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 9%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 38%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 26%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 64%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 36%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 7 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (iv) (ආ) වන අතර එහි පහසුතාව 70%කි. එසේම පහසුතාව අඩුම කොටස (iv) (අ) වන අතර එහි පහසුතාව 42%කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාවය මෙම ප්‍රස්තාරවලින් දැක් වේ.

(i) අනු කොටස සඳහා පහසුතාව 61%කි. මෙසේ වීමට බලපා ඇත්තේ සාමාන්‍ය ව්‍යාපාරිකයකුගෙන් ව්‍යවසායකයෙකු වෙන්කර ගැනීමේ කුසලතාවය සිසුන් තුළ නොමැති බවයි. ව්‍යවසායක ගතිලක්ෂණ අනෙකුත් පාර්ශව සමග සන්සන්දනය කිරීමේ හැකියාව ප්‍රගුණ කළ යුතු ය.

(ii) අනු කොටස සඳහා පහසුතාව 60%කි. මෙම කොටසට පිළිතුරු සැපයීමේ දී සාධනයට ලක්කළ හේතු පැහැදිලි කිරීමේ දුර්වලතාවය දක්නට ලැබුණි. පිළිතුරු පැහැදිලි කළ යුතු අවස්ථාවල පැහැදිලි කිරීමට සිසුන් දැනුවත් කළ යුතු ය.

(iv) ''අ'' අනු කොටසෙහි පහසුතාව 42%කි. මෙයට හේතු වී ඇත්තේ අදාළ සිද්ධිය පැහැදිලිව තේරුම් ගැනීමට සිසුන්ට නොහැකි වීමයි.

(v) ''ආ'' අනු කොටසෙහි පහසුතාව 57%කි. තනි ප්‍රශ්නයක් තුළ ප්‍රශ්න කිහිපයක් විමසන අවස්ථාවලදී ඒ සියලු ප්‍රශ්න අවබෝධ කරගෙන පිළිතුරු ලිවීමට සිසුන් දැනුවත් කළ යුතු බ ව මෙයින් පැහැදිලි වේ.

4 ප්‍රශ්නය

4. (i) (අ) ධනසිරි ඔහුගේ භාර්යාවගේ ජීවිතය වෙනුවෙන් යාවජීව ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබා ගෙන තිබුණි. පසු කලෙක භාර්යාව ඔහුගෙන් දික්කසාද විය. නොබෝ කලකින් ඇය මිය ගියා ය. රක්ෂණ සමාගම රක්ෂිත මුදල ධනසිරිට ගෙවිය යුතු ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) ගින්නට අමතරව ආනුෂංගික අලාභ රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය කෙරෙන වෙනත් අවදානම් කවරේ ද?

(ලකුණු 04 යි)

(ii) (අ) වාචික සන්නිවේදන ක්‍රම නම් කරමින් වාචික සන්නිවේදනයේ ඇති වාසි සාකච්ඡා කරන්න.

(ආ) 'අවිධිමත් සන්නිවේදනය' යනු කුමක් දැ'යි පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(iii) පහත දැක්වෙන්නේ ආනයන, අපනයන වෙළෙඳාමේ දී භාවිත කෙරෙන ලියකියවිලි කිහිපයකි. එම ලියකියවිලිවලින් අපේක්ෂා කරන්නේ කුමක් දැ'යි වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න.

(අ) නෞභාර පත්‍රය

(ආ) ණයවර ලිපිය

(ඇ) ප්‍රභවස්ථාන සහතිකය

(ඈ) ආනයන සටහන්කරය *(ලකුණු 04 යි)*

(iv) "විද්‍යුත් වාණිජ්‍යය තුළින් ව්‍යාපාරිකයාට සහ පාරිභෝගිකයාට පමණක් නොව සමස්ත සමාජයට ම ප්‍රතිලාභ හිමි වේ." සමාජයට හිමි වන ප්‍රතිලාභ ගැන විමසීමක් කරන්න. *(ලකුණු 04 යි)*

(v) රටක ආර්ථික හා සමාජ සංවර්ධනය උදෙසා ප්‍රවාහන සේවාවෙන් ඉටු වන කාර්යභාරය පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(මුළු ලකුණු 20 යි)

4. (i) (අ) ගෙවිය යුතු ය. **(ලකුණු 01යි)**

ජීවිත රක්ෂණයේ දී රක්ෂණ හිමිකම අවශ්‍ය වන්නේ ගිවිසුමට එළඹෙන අවස්ථාවේ දී පමණි. **(හේතුව සඳහන් කිරීමට ලකුණු 01යි)**

(ආ) 1. ව්‍යාපාර කටයුතු ඇන හිටීම
2. ලාභය අහිමි වීම
3. ගින්න නිවීමට ගත් උත්සාහය නිසා වන අලාභ
4. සේවක වැටුප්, ගෙවල් කුලී වැනි වියදම් දැරීමට සිදු වීම
5. ගින්න මැඩ පැවැත්වීම සඳහා දරණ වියදම් **(කරුණු 02කට ලකුණු 02යි)**

(ii) (අ)

i. රැස්වීම්
ii. සාකච්ඡා
iii. සම්මන්ත්‍රණ
} මුහුණට මුහුණලා (face to face)

iv. දුරකථන ඇමතුම් **(කරුණු 02කට ලකුණු 01යි)**

වාසි

i. ප්‍රතිචාර ක්ෂණිකව ලැබීම
ii. තොරතුරු යවන්නා හා ලබන්නා සම්මුඛ වීම
iii. විස්තරාත්මකව ඉදිරිපත් කළ හැකි වීම
iv. අපැහැදිලි තැන් ක්ෂණිකවම පැහැදිලි කරගත හැකි වීම
v. අංග චලනය භාවිත කරමින් ප්‍රබල සන්නිවේදනයක් කළ හැකි වීම

(වාසි 02කට ලකුණු 01යි)

(ආ) සංවිධානයක ඇති අවිධිමත් කණ්ඩායම් අතර පවත්නා නිල නොවන සන්නිවේදන ක්‍රම

උදා: නිර්නාමික ලිපි / නිර්නාමික දුරකථන ඇමතුම් / කට කථා

(ලකුණු 02යි)

(iii) (අ) නැව් සමාගමක් කිසියම් භාණ්ඩ තොගයක් නිශ්චිත ස්ථානයකට ගෙන ගොස් භාර දීමට භාරගත් බව

(ආ) අපනයනකරුට මුදල් ලැබීම තහවුරු කිරීම

(ඇ) වරණීය තීරුබදු සහන ලබා ගැනීම

(ඈ) ආනයනකරුට වරායට ලැබුණු භාණ්ඩවල අයිතිය ප්‍රකාශ කිරීම **(ලකුණු 04යි)**

(iv) (අ) සමාජීය ප්‍රතිලාභ

i. ගෝලීය වෙළෙඳපොළට පිවිසිය හැකි වීම

ii. දුර බැහැර ප්‍රදේශවල අයට ද අන්තර්ජාලයට පිවිසිය හැකි වීම

iii. ජීවන තත්ත්වය ඉහළ යාම

iv. නව රැකියා අවස්ථා ලැබීම

v. පිරිවැය අඩු වීම **(කරුණු 04කට ලකුණු 04යි)**

(v) i. නිෂ්පාදිතය සඳහා ස්ථානීය උපයෝගීතාවයක් ලබා දීම

ii. ශ්‍රමය හා වෙනත් ද්‍රව්‍ය ආදිය පහසුවෙන් ලබාගත හැකි වීම

iii. නිෂ්පාදනය, බෙදා හැරීම, අලෙවිය වේගවත් වීම

iv. භාණ්ඩ නශ්‍ය වීම අඩුකර ගත හැකි වීම

v. සමාජ සම්බන්ධතා පුළුල් වීම

vi. විනෝද චාරිකා

vii. සංචාරක කර්මාන්තය සඳහා

viii. වෙනත් පිළිගත හැකි කරුණු

(කරුණු 04ට ලකුණු 04යි)

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා:



4 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 61%කි. (ප්‍රස්තාරය 02) II ප්‍රශ්න පත්‍රයෙහි I කොටසෙන් අඩුම ප්‍රතිශතයක් තෝරා ගත් ප්‍රශ්නය මෙයයි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 41%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 6%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 34%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 66%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 10 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (ii) (අ) කොටස වන අතර එහි පහසුතාව 76%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (i) (ආ) කොටස වන අතර එහි පහසුතාව 8%කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාව පිළිබඳ ප්‍රස්තාරයෙන් දැක් වේ.

(i) ''අ'' අනු කොටසෙහි පහසුතාව 27%කි. එයට හේතු වී ඇත්තේ, ජීවිත රක්ෂණයේ දී ඔප්පුව මිලදී ගන්නා විට හිමිකම නම් කළ යුතු බවත්, ජීවිත රක්ෂණයේ දී රක්ෂණ හිමිකම අවශ්‍ය වන්නේ, ගිවිසුමට එළඹෙන අවස්ථාවේ දී පමණක් බවත්, සිසුන් තුළ අවබෝධය නොමැති වීමත් ය. සිසුන් රක්ෂණ මූලධර්ම පිළිබඳව නිවැරදි අවබෝධයකින් යුක්තව පිළිතුරු සැපයූ බවක් නොපෙනේ. එමෙන්ම රක්ෂණ ඔප්පු මිලදී ගන්නා අවස්ථාවල සහ වන්දි අයදුම්කරන අවස්ථාවල රක්ෂණ මූලධර්ම පිළිබඳව වෙනස්කම් අවබෝධ කර දීමට ක්‍රියා කළ යුතු ය.

මෙහි ''ආ''හි පහසුතාව 8%කි. මෙසේ පහසුතා මට්ටම පහළ යාමට හේතුව ආනුෂංගික අලාභ රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය කෙරෙන අවදානම් නිවැරදිව අවබෝධකර නොගැනීමයි. ඒ වෙනුවට ගිනි රක්ෂණ ඔප්පුව තුළින් ආවරණය කෙරෙන අනෙකුත් අවදානම් ආනුෂංගික අලාභ ලෙස සලකා පිළිතුරු සපයා තිබුණි. ඒ අනුව ගිනි රක්ෂණය තුළින් ලබාගත හැකි අතිරේක අවදානම් හා ආනුෂංගික අලාභ රක්ෂණ ආවරණ පිළිබඳව නිවැරදි අවබෝධයක් සිසුන්ට ලබා දිය යුතු ය.

(ii) ''ආ'' අනු කොටසෙහි පහසුතාව 37%කි. මෙසේ බලපා ඇත්තේ, අවිධිමත් සන්නිවේදනය යන්න නිවැරදිව අර්ථ දැක්වීමට නොහැකි වීමයි.

(iii) ''ඇ'' අනු කොටසෙහි පහසුතාව 35%ක් වන අතර,. මෙහි ''ඈ'' හි පහසුතාව 27%කි. මෙම ප්‍රශ්නය තුළින් බලාපොරොත්තු වන්නේ ලියවිලි අර්ථ දැක්වීම නොව ඒවායින් අපේක්ෂිත කාර්යයන් ය. එම නිසා ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගෙන එයට ගැළපෙන පිළිතුරු සැපයීමට අයදුම්කරුවන් යොමු කළ යුතු ය.

5 ප්‍රශ්නය

5. (i) පහත දැක්වෙන්නේ ආයතන දෙකක සංවිධාන සටහන් දෙකකි.

A



B



ඉහත A සංවිධාන සටහන උස *(tall)* එකකි. B සංවිධාන සටහන සමතල *(flat)* එකකි. සංවිධාන මූලධර්මවලට අනුව මෙම සංවිධාන ව්‍යුහයන්හි යෝග්‍ය අයෝග්‍යතා පෙන්නුම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) කරුණාදස විදුහල්පතිවරයෙකි. බලදස ද විදුහල්පතිවරයෙකි. කරුණාදස සිය උපවිදුහල්පතිවරුන්ට හා අංශ ප්‍රධානීන්ට බලතල හා වගකීම් පවරයි. තීරණ ගැනීමේ දී ඔහු ගුරු මණ්ඩලයේ පමණක් නොව සිසුන්ගේ ද අදහස් සැලකිල්ලට ගනී. බලදස බලතල හා වගකීම් පැවරීමක් නොකර තමා වෙත ම රඳවා ගනී. තීරණ ගැනීම ද තමාගේ මතයට අනුව සිදු කෙරේ.

(අ) කරුණාදස හා බලදස යන විදුහල්පතිවරුන්ගේ නායකත්ව ශෛලීන් වෙන් වෙන්ව සඳහන් කරන්න.

(ආ) ඒ අතුරෙන් වඩාත් යෝග්‍ය නායකත්ව ශෛලිය කුමක් දැ'යි හේතු සහිතව පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(iii) "අධ්‍යයනය කිරීමේ පහසුව සඳහා කළමනාකරණ ක්‍රියාවලිය මූලික කොටස් හතරකට බෙදා දක්වුව ද ක්‍රියාත්මක වීමේ දී ඒ සියල්ල අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතී." මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. *(ලකුණු 04 යි)*

(iv) විස්කම්, පාරම්පරිකව පැවති ගෙන ආ අත්කම් භාණ්ඩ *(handicraft)* කර්මාන්තශාලාවක නිර්මාණය කරුවෙකි. මේ දක්වා ඔහු සිය නිෂ්පාදන කටයුතු සිදු කළේ ඇණවුම් මතයි. ඔහුගේ නිර්මාණ සඳහා පැවති ඉල්ලුම තරමක් වැඩි වූ බැවින් සිය නිෂ්පාදන ක්‍රියාවලිය ඇණවුම් ක්‍රමයෙන් ප්‍රවාහ *(flow)* ක්‍රමයට පරිවර්තනය කිරීමට විස්කම් අදහස් කරයි.

(අ) ඇණවුම් (කාර්ය) නිෂ්පාදන ක්‍රමයෙන් ප්‍රවාහ නිෂ්පාදන ක්‍රමයට අවතීර්ණ වුවහොත් විස්කම්ට මුහුණ පෑමට සිදු විය හැකි ගැටලු කවරේ ද?

(ආ) වඩාත් ම යෝග්‍ය නිෂ්පාදන ක්‍රමය තෝරා ගැනීමේ දී විස්කම් විසින් සැලකිල්ලට ගත යුතු සාධක මොනවා ද? *(ලකුණු 04 යි)*

(v) (අ) "නිෂ්පාදන ආයතනයක තත්ත්ව පාලනයේ දී සිදු වන්නේ නිමි භාණ්ඩ පරීක්ෂාවට ලක් කිරීම පමණි." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) කිසියම් නිෂ්පාදන සමාගමක් සිය කර්මාන්තශාලා සඳහා යෝග්‍ය ස්ථානයක් තෝරා ගැනීමේ දී සැලකිය යුතු සාධක **හතරක්** නම් කර, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(මුළු ලකුණු 20 යි)

5. (i) (A) උස් වූ සංවිධාන ව්‍යුහය / පටු පාලන අවකාශය

යෝග්‍යතා	**අයෝග්‍යතා**
1. පටු පාලන අවකාශයක් ඇති නිසා සමීප සුපරීක්ෂණය	1. කළමනාකරණ තනතුරු වැඩි නිසා පරිපාලන පිරිවැය වැඩි වීම
2. බලතල පැවරීම නිසා පහළ කළමනාකරුවන් අභිප්‍රේරණය වීම	2. තීරණ ගැනීම ප්‍රමාද වීම
	3. සන්නිවේදනය අපහසු වීම

(B) සමතල සංවිධාන / පුළුල් පාලන අවකාශය

යෝග්‍යතා	**අයෝග්‍යතා**
1. ඉහළ තනතුරු අඩු නිසා පරිපාලන වියදම් අඩුය	1. සේවක සුපරීක්ෂණය අපහසුය
2. තීරණ ගැනීම වේගවත්ය	2. මාර්ගෝපදේශය අඩුය
3. සේවක අභිප්‍රේරණය වීම	3. ඉහළ කළමනාකරුවන්ගේ කාර්යයන් අධික වීම
	4. කළමනාකරුවන් හා සේවකයන් අතර සබඳතා අඩුය

(යෝග්‍යතා 02කට ලකුණු 02යි)

(අයෝග්‍යතා 02කට ලකුණු 02යි)

(ii) (අ) කරුණාදාස විදුහල්පති - ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වය **(ලකුණු 01යි)**

බලදාස විදුහල්පති - ඒකාධිපති නායකත්වය **(ලකුණු 01යි)**

(ආ) ශිෂ්‍යයා තෝරාගත් නායකත්ව ශෛලීය හේතු සහිතව පැහැදිලි කිරීම සඳහා (පාසලේ දැඩි විනයක් පවත්වාගත යුතු නිසා ඒකාධිපති නායකත්ව ශෛලිය ද සුදුසු විය හැක.)

(ලකුණු 02යි)

(iii)



සංවිධානයේ අරමුණු හා පරමාර්ථ ඉටු කිරීම සියලුම කළමනාකරණ කාර්යයන් එකිනෙකට සම්බන්ධව ක්‍රියාත්මකවන බව පැහැදිලි කිරීමට **(ලකුණු 04යි)**

(පිළිතුරේ සාර්ථකත්වය අනුව ලකුණු පිරිනමන්න)

(iv) (අ) i. විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කළයුතු වීම නිසා මූල්‍ය දුෂ්කරතා මතුවීම
ii. ගනුදෙනුකරුගේ කැමැත්තට අනුව නිපදවීම සිදු නොවන නිසා වෙළෙඳපොළ ගැටළු මතුවීම
iii. දැඩි තරගකාරීත්වයට මුහුණ දීමට සිදු වීම
iv. නිර්මාණශීලිත්වයට ඉඩ ඇහිරීම

(පැහැදිලි කරුණු 02කට ලකුණු 04යි)

(ආ) i. නිෂ්පාදිතයේ ස්වභාවය
ii. වෙළෙඳපොළ ප්‍රමාණය
iii. දැරියයුතු පිරිවැය
iv. යොදා ගන්නා තාක්ෂණය
v. සම්පත් ලබා ගැනීමේ පහසුව **(ඕනෑම කරුණු 02කට ලකුණු 04යි)**

(v) (අ) එකඟ නොවේ. **(ලකුණු 1/2යි)**

නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අදියරක්ම පරීක්ෂාවට ලක්කිරීම තත්ත්ව පාලනයේ දී සිදු වේ.
i. **අමුද්‍රව්‍ය, යන්ත්‍ර උපකරණ, සේවකයින් ආදි සියලුම යෙදවුම්** ප්‍රමිතියට අනුව නිපදවිය යුතුයි.
ii. **නිෂ්පාදන ක්‍රියාවලිය** පරීක්ෂාවට ලක්කළ යුතුයි.
iii. **අවසාන නිෂ්පාදිතය** පරීක්ෂා කළ යුතුයි.

(1/2 බැගින් ලකුණු 1 1/2යි)

(ආ) i. වෙළෙඳපොළට ආසන්න වීම
ii. ප්‍රවාහන ජාලය (ගුවන් තොටුපලට, වරායට, ප්‍රධාන මාර්ගයට ආසන්න වීම.)
iii. අපද්‍රව්‍ය බැහැර කිරීම
iv. අමුද්‍රව්‍ය ලබා ගැනීම
v. යටිතල පහසුකම්වල ප්‍රමාණවත් බව
vi. රජයේ නීති රීති / පාරිසරික නීති රීති
vii. රජයේ දිරිගැන්වීම්
viii. කාලගුණික හා දේශගුණික තත්ත්වයන්

(කරුණු 04 නම් කිරීමට ලකුණු 01යි)
(කරුණු 4ක් පැහැදිලි කිරීමට ලකුණු 01යි)

5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



5 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 64%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 12%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 35%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 66%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 34%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 8 අතුරෙන් පහසුතාව වැඩිම කොටස වන්නේ (ii) (අ) කොටස වේ. එහි පහසුතාව 80% වේ. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (v) (අ) වන අතර එහි පහසුතාව 58% කි. සෙසු අනුකොටස්වල පහසුතාව ප්‍රස්තාරයෙන් දැක් වේ.

(i) අනු කොටසෙහි පහසුතාව 59%කි. මෙහි දී සංවිධාන ව්‍යුහයක් ආශ්‍රයෙන් උස් හෝ සමතල සංවිධාන ව්‍යුහයන් අවබෝධ කරගැනීමේ දුර්වලතාවය පැවැති බව පෙනේ. සංවිධාන සටහන් ආශ්‍රයෙන් පටු, පුළුල් පාලන අවකාශ පිළිබඳව පංති කාමරය තුළදී ක්‍රියාකාරකම් මගින් අයදුම්කරුවන් දැනුවත් කිරීමෙන් මෙය මඟහරවා ගත හැකිය.

(iii) අනු කොටසෙහි පහසුතාව 61%කි. මෙහි දී සංවිධානයේ අරමුණු හා පරමාර්ථ ඉටු කිරීමට සියලුම කාර්යයන් එකිනෙකට සම්බන්ධව ක්‍රියාත්මක වන බව පැහැදිලි කිරීමට අයදුම්කරුවන් අපොහොසත් වී ඇත. කළමනාකරණ ක්‍රියාවලියේ මූලික කොටස් අතර පවතින අන්තර් සම්බන්ධතාවය පැහැදිලි වන ලෙස පිළිතුරු ගොඩනැඟීමට සිසුන්ට මඟ පෙන්විය යුතු යි.

(v) ''අ'' අනු කොටසෙහි පහසුතාව 58%කි. නිෂ්පාදන ආයතනයක තත්ත්ව පාලන ක්‍රියාවලිය තුළ සෑම අදියරක් ම පරීක්ෂාවට ලක් කෙරෙන බව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී තහවුරු කළ යුතු ය.

6 ප්‍රශ්නය

6. (i) ව්‍යාපාර ආයතනයක පර්යේෂණ හා සංවර්ධන අංශය භාර කළමනාකරු විසින් එම අංශයේ කටයුතු පුළුල් කිරීමට මුදල් ඉල්ලා සිටි විට, මූල්‍ය කළමනාකරු විසින් ප්‍රකාශ කරනු ලැබුයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලට මුදල් වැය කරනවාට වඩා, ප්‍රචාරණ කටයුතු පුළුල් කළහොත් වෙළෙඳපොළ කොටස වැඩි කර ගත හැකි බවයි. මූල්‍ය කළමනාකරුගේ මෙම ප්‍රකාශයට එරෙහිව ඔබට කුමක් කිව හැකි දැ'යි පැහැදිලි කරන්න.
(ලකුණු 04 යි)

(ii) (අ) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයක් වන ස්ථානය *(place)* හෙවත් බෙදා හැරීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ආ) බෙදාහැරීමේ මාර්ගයක් තෝරා ගැනීමේ දී අලෙවිකරු සැලකිල්ලට ගත යුතු සාධක කවරේ දැ'යි සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) කිසියම් නිෂ්පාදිතයක් වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේ දී ඊට මිලක් නියම කළ යුතු ය. වඩා යෝග්‍ය මිල කිරීමක දී අලෙවිකරුවකු අවධානය යොමු කළ යුතු සාධක පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. *(ලකුණු 04 යි)*

(iv) රූ සැරසුම්හලක් *(Beauty Parlour Salon)* පවත්වාගෙන යන බියට්‍රිස්ට සිය සේවාව ප්‍රචාරණය කිරීමේ වැඩසටහනක් ඉදිරිපත් කිරීමට අවශ්‍යව ඇත. මේ සඳහා පහත සඳහන් මාධ්‍යවලින් එකක් තෝරා ගැනීමට ඇය අදහස් කරන්නී ය.

- රූපවාහිනිය *(TV)*
- ගුවන් විදුලිය*(Radio)*
- කාන්තා සඟරාවක් *(Womens' Magazine)*
- විස්තර පත්‍රිකා *(Brochures)*
- අන්තර්ජාල වෙබ් අඩවියක් *(Website)*
- ඉරිදා පුවත්පතක් *(Sunday Newspaper)*

බියට්‍රිස්ට අවශ්‍ය තීරණය ගැනීමට සහායක් වශයෙන් ඉහත මාධ්‍යයන්හි වාසි හා අවාසි පිළිබඳ සැසඳීමක් පිළියෙල කරන්න. *(ලකුණු 04 යි)*

(v) "මුදල් වැඩිපුර රඳවා නොගත යුතු ය. ප්‍රමාණවත් මුදලක් රඳවා ගත යුතු ය." මෙම අදහස ව්‍යාපාරයකට වැදගත් වන්නේ ඇයි? පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(මුළු ලකුණු 20 යි)

6. (i) මූල්‍ය කළමනාකරුගේ ප්‍රකාශය වැරදිය.

පර්යේෂණ හා සංවර්ධන නිසා

- නව නිෂ්පාදිත බිහි වේ / නව නිෂ්පාදන ක්‍රම බිහි වේ / නව ද්‍රව්‍ය බිහි වේ
- භාණ්ඩ නවීකරණය කළ හැකි වේ
- නිෂ්පාදන පිරිවැය අඩු වේ
- නාස්තිය අවම වේ
- නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩි වේ
- තරගකාරිත්වයට මුහුණදිය හැකි වේ
- නිෂ්පාදිතයේ ක්‍රියාකාරීත්වය හා ගුණත්වය ඉහළ යාම සිදුවේ
- නිෂ්පාදිත සඳහා ඉල්ලුම ඉහළ යාම සිදුවේ **(කරුණු 04කට ලකුණු 04යි)**

(ii) (අ) 1. පාරිභෝගිකයා වෙතට භාණ්ඩ ලබා දීමට නම්, වෙළෙඳපොළේ භාණ්ඩය සුලභ කළ යුතුය. ඒ සඳහා කලට වේලාවට අවශ්‍ය ස්ථානයකට බෙදා හැරීම වැදගත් වේ.

2. අලෙවිකරණ මිශ්‍රයේ අනෙකුත් සාධක ක්‍රියාත්මක වුව ද බෙදා හැරීම අසාර්ථක නම් අලෙවිකරණ ක්‍රියාවලියම අසාර්ථක වේ.

(මෙම කරුණු 02ක් සහිත පැහැදිලි කිරීමට ලකුණු 02යි)

(ආ) 1. වෙළෙඳපොළ ස්වභාවය / පාරිභෝගිකයා කවුද? යන්න
2. භාණ්ඩයේ ස්වභාවය - නශ්‍යවනවා ද, බිඳෙන සුළු ද, සංකීර්ණ බව
3. නිෂ්පාදකයා - ඔහුගේ මූල්‍ය ශක්තිය, ප්‍රවාහන පහසුකම්, ගබඩා පහසුකම්
4. නීතිමය තත්ත්වයන් - බලපත්‍ර ලබා ගත යුතු ද යන්න
5. දැරිය යුතු පිරිවැය
6. තරගකරුවන්ගේ බෙදාහැරීමේ මාර්ග

(කරුණු 04කට 1/2 බැගින් ලකුණු 02යි)

(iii)

1. ආයතනයේ පරමාර්ථ
2. පිරිවැය
3. ඉල්ලුම / ගනුදෙනුකරුගේ අපේක්ෂා
4. තරගකරුවන්ගේ මිල
5. අලෙවිකරණ මිශ්‍රයේ අනිකුත් සාධක (නිෂ්පාදිතය, ස්ථානය, ප්‍රවර්ධනය)
6. රජයේ නීතිරීති (උදා: මිල පාලනය)

(ඕනෑම කරුණු 04ක් පැහැදිලි කිරීමට ලකුණු 04යි)

(iv)

මාධ්‍යය	වාසි	අවාසි
රූපවහානිය	1. ආවරණය පුළුල් ය. 2. ශ්‍රව්‍ය - දෘශ්‍ය වේ. 3. වෙනත්	1. පිරිවැය වැඩි ය. 2. මතකයේ රැඳීම අඩු ය. 3. වෙනත්
ගුවන් විදුලිය	1. ආවරණය පුළුල් ය. 2. මිහිරි නාද සහිතව ඉදිරිපත් කළ හැකිය. 3. වෙනත්	1. පිරිවැය වැඩි ය. 2. දෘශ්‍ය නොවේ / ශ්‍රවණයට පමණයි. 3. වෙනත්
කාන්තා සඟරාවක්	1. ඉලක්ක වෙළෙඳපොළ ග්‍රහණය කල හැක. 2. පිරිවැය අඩු ය. 3. වෙනත්	1. ග්‍රාහක පිරිස අඩු ය. 2. කාලීනව නිකුත්වන නිසා පමා කාලය වැඩි ය. 3. වෙනත්
විස්තර පත්‍රිකා	1. පිරිවැය අඩු ය. 2. ඉලක්ක ග්‍රාහකයන් වෙත ඉදිරිපත් කළ හැකි ය. 3. වෙනත්	1. විශ්වාසය අඩු වීම. 2. කුඩා පිරිසක් ආවරණය වීම. 3. වෙනත්
අන්තර්ජාල වෙබ් අඩවි	1. ව්‍යාප්තිය වැඩි ය. 2. පිළිගැනීම වැඩි ය. 3. වෙනත්	1. තාක්ෂණික දැනුම අවශ්‍ය වේ. 2. වෙබ් අඩවි විශාල ප්‍රමාණයක් පැවතීම නිසා සොයා ගැනීම අපහසුය. 3. වෙනත්
ඉරිදා පුවත්පතක්	1. පාඨක පිරිස වැඩි ය. 2. විශ්වාසය වැඩි ය. 3. වෙනත්	1. සාක්ෂරතාවය අවශ්‍ය වීම. 2. ඉලක්ක ගනුදෙනුකරුවන් ග්‍රහණය කිරීම අපහසුය. 3. වෙනත්

(වාසි 06කට ලකුණු 02යි)

(අවාසි 06කට ලකුණු 02යි)

(වාසි / අවාසි 04කට හෝ 05කට ලකුණු 01යි)

(04කට අඩු නම් ලකුණු නැත)

(v) මුදල් අනවශ්‍ය පරිදි රඳවාගත හොත් එය අනවශ්‍ය පිරිවැයක් වන අතර එහි දී ලාභදායීත්වය අඩුවේ. එය ව්‍යාපාරයට අවාසියකි. එසේම මුදල් අවශ්‍ය ප්‍රමාණයට රඳවා නොගත හොත් ද්‍රවශීලතා ගැටළු මතුවේ. එම නිසා ප්‍රශස්ත මුදල් ප්‍රමාණයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු ය.

(අංශ දෙකම පැහැදිලි කිරීමට ලකුණු 04)

6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



6 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 62%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 11%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 37%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 63%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 6 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (iv) වන අතර එහි පහසුතාව 50%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (v) කොටස වන අතර එහි පහසුතාව 35%කි. සෙසු කොටස්වල පහසුතාව ප්‍රස්තාරයෙන් දැක් වේ.

(i) අනු කොටස සඳහා පහසුතාව 39%කි. මෙසේ පහසුතාව පහළ යාමට හේතුව සෘජුව ප්‍රශ්නයක් විමසනවා වෙනුවට සිද්ධියක් ආශ්‍රයෙන් ප්‍රශ්නයක් විමසු විට සාර්ථකව පිළිතුරු සැපයීමට සිසුන් අපොහොසත් වීමයි. මෙම ගැටලුව මඟහරවා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් සංවිධානය කර ගත යුතුය.

(ii) ''අ'' අනු කොටසෙහි පහසුතාව 36%කි. අලෙවිකරණ මිශ්‍රයෙහි විචල්‍යයක් වන ''ස්ථානය'' පිළිබඳව අවබෝධයක් ඇතත් එහි වැදගත්කම ''ස්ථානය'' ආශ්‍රයෙන් පැහැදිලි කිරීමට නොහැකි වීම පහසුතාව පහළ යෑමට හේතුවයි. අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය පිළිබඳ අවබෝධය මෙන්ම ඒ ඒ විචල්‍යයේ වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබා දීමට ගුරුභවතුන් කටයුතු කළ යුතු ය. මෙහි ''ආ'' ප්‍රශ්නයෙහි පහසුතාව 43%කි. මෙසේ පහසුතා මට්ටම පහළ යාමට හේතුව විය හැක්කේ බෙදා හැරීමේ මාර්ගයක් තෝරා ගැනීමේ දී අලෙවිකරුවෙකු සැලකිලිමත් විය යුතු කරුණු කෙරෙහි අවධානය යොමු නොකර තිබීමය.

(v) අනු කොටසෙහි පහසුතාවය 35%කි. ලාභදායිත්වය හා ද්‍රවශීලතාවය යන සංකල්ප එකිනෙකට ගැටෙන බව අයදුම්කරුවන් අවබෝධ කර ගෙන නොතිබුණ නිසා පහසුතා මට්ටම පහළ ගොස් ඇත. ව්‍යාපාරයක් සාර්ථකව පවත්වාගෙන යාමට මේ දෙඅංශයේම වැදගත්කම සිසුන්ට අවබෝධකර දිය යුතුය.

7 ප්‍රශ්නය

7. (i) පීටර් සිල්ලර බඩු වෙළෙඳසැලක අයිතිකරුවෙකි. සිල්ලර බඩු වෙළෙඳසැල අවට ප්‍රදේශයේ ජනගහනය වැඩි වීම නිසා ඔහුගේ ගනුදෙනුකරුවන් සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වැඩි විය. මේ නිසා සිය වෙළෙඳසැල, කුඩා සුපිරි වෙළෙඳසැලක් *(Mini Super Market)* ලෙසට පුළුල් කිරීමට පීටර් අදහස් කළේ ය. පුළුල් කිරීමට අවශ්‍ය අරමුදල් මේ දක්වා සිය ව්‍යාපාරයේ රඳවා ගත් ලාභ මගින් සපුරා ගැනීමටත්, භාණ්ඩ තොග බැංකු ණයක් මගින් හෝ වෙළඳ ණය *(Trade Credit)* මගින් මූල්‍යනය කිරීමටත් ඔහු තීරණය කර ඇත.

(අ) සිය ව්‍යාපාරය පුළුල් කිරීමට රඳවා ගත් ලාභ උපයෝගී කර ගැනීමෙන් පීටර්ට අත්විය හැකි වාසි හා අවාසි ගැන විමසීමක් කරන්න.

(ආ) බඩු තොග ලබා ගැනීම සඳහා බැංකු ණය හෝ වෙළෙඳ ණය යොදු ගැනීමේ සාපේක්ෂ වාසි හා අවාසි පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(ii) (අ) 'ලාභය *(profit)*' සහ 'ලාභදයකත්වය *(profitability)*' අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

(ආ) මූල්‍ය මාර්ගයක් ලෙස ණය සාධ්‍යකරණය *(debit factoring)* යොදු ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(iii) ව්‍යාපාර ආයතනයක අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම උදෙසා මානව සම්පත් කළමනාකරණයට *(HRM)* කොතෙක් දුරට දායක විය හැකි ද? සාකච්ඡා කරන්න. *(ලකුණු 04 යි)*

(iv) (අ) ව්‍යාපාර ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක පුරප්පාඩුවක් පවතී. මේ සඳහා අභ්‍යන්තරයෙන් ආකර්ෂණය කර ගන්නවා ද? බාහිරව ආකර්ෂණය කර ගන්නවා ද? යන්න තීරණය කළ යුතුව ඇත. මෙම දෙඅංශයේ පවත්නා වාසි වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න.

(ආ) යහපත් ශ්‍රමික සම්බන්ධතාවක් තුළින් ව්‍යාපාර ආයතනයකට ලබා ගත හැකි ප්‍රතිලාභ කවරේ ද? *(ලකුණු 04 යි)*

(v) බොහොමයක් ආයතන රැකියා පුරප්පාඩු පිරවීමට අයදුම්පත් කැඳවන විට, ඒ හා සමග ජීව දත්ත විස්තරයක් *(Curriculum Vitae - CV)* ද ඉල්ලා සිටී. මෙවැනි ජීව දත්ත විස්තරයක අවශ්‍යයෙන් ම ඇතුළත් විය යුතු තොරතුරු සඳහන් කරන්න. **(සැ.යු. - ඔබේ නම්, ලිපිනයන් සඳහන් කිරීම අවශ්‍ය නැත.)** *(ලකුණු 04 යි)*

(මුළු ලකුණු 20 යි)

7. (i) (අ) රඳවාගත් ලාභ උපයෝගී කර ගැනීම :-

වාසි	අවාසි
1. පිරිවැයක් නැත 2. ලබා ගැනීම පහසුය 3. ව්‍යාපාරයෙන් පිටතට ඇදී යාමට ඇති මුදල්, ආයෝජනය වාසි දායකය	1. අත්‍යවශ්‍ය අවස්ථාවක ප්‍රයෝජනයට ගත හැකි මූල්‍ය මාර්ගය අහිමි වීම
(වාසි 01කට ලකුණු 01යි)	**(අවාසි 01කට ලකුණු 01යි)**

(ආ) බැංකු ණය හෝ වෙළෙඳ ණය යොදා ගැනීම :-

බැංකු ණය වාසි	වෙළෙඳ ණය වාසි
1. නම්‍යශීලී වීම 2. ලබා ගැනීම පහසුය 3. අවශ්‍ය විට පියවිය හැකි වීම	1. පොළී රහිත වීම 2. පසුව ගෙවීම් කළ හැකි වීම 3. කේවල් කිරීම කළ හැකි වීම
(වාසි 01කට ලකුණු 1/2යි)	**(අවාසි 01කට ලකුණු 1/2යි)**

බැංකු ණය අවාසි	වෙළෙඳ ණය අවාසි
1. දැඩි ගිවිසුමකට යටත් වීම 2. පොළී ගෙවීමට සිදු වීම 3. ඇප සුරැකුම් අවශ්‍ය වීම	1. මිල වැඩි වීම 2. කොන්දේසිවලට යටත් වීමට සිදු වීම 3. වෙනත් පාර්ශව සමඟ සම්බන්ධතා පළුදු විය හැකි වීම
(වාසි 01කට ලකුණු 1/2යි)	**(අවාසි 01කට ලකුණු 1/2යි)**

(ii) (අ) ලාභය - ව්‍යාපාරයේ වියදම ඉක්මවා ඇති ආදායම් ප්‍රමාණයයි.
ලාභදායකත්වය - යෙදූ ප්‍රාග්ධනයට හෝ විකුණුම්වලට සාපේක්ෂව, උපයන ලාභය කොපමණ ද යන මිනුමකි. මූල්‍ය තීරණ ගැනීමේ දී වැදගත් වන්නේ ලාභදායකත්වයයි.

(කරුණු 02 පැහැදිලි කිරීමට ලකුණු 01යි)

(ආ) ණයට විකිණීමේ දී ණයගැතියන් ඇති වේ. ණයගැතියන් වත්කමකි. නමුත් එම වත්කම වහාම මුදල් කර ගත නොහැකිය. එබැවින් ණයගැතියන්ගේ වටිනාකම ණය සාධ්‍යකරුවෙකුට පවරා එහි වටිනාකමින් කිසියම් ප්‍රතිශතයක් ව්‍යාපාරයට ලබා දෙයි. පසුව ණයගැතියන්ගෙන් මුදල් රැස්කර ගැනීමේ වගකීම සාධ්‍යකයාට පවරයි.

(ලකුණු 02යි)

(iii) සේවකයන් ඵලදායී ලෙස යොදා නොගතහොත් ආයතනයේ අරමුණු ඉටුකර ගත නොහැකිය. තෘප්තිමත් සේවක හමුදාවක් මගින් ආයතනයේ අපේක්ෂිත අරමුණු පහසුවෙන් ඉටුකර ගත හැකි වේ. එම නිසා ඵලදායී හා තෘප්තිමත් සේවක හමුදාවක් ඇතිකර ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණය වැදගත් වේ. **(ලකුණු 04යි)**

(iv) (අ)

අභ්‍යන්තර ආකර්ෂණයේ වාසි	**බාහිර ආකර්ෂණයේ වාසි**
1. ව්‍යාපාරය කෙරෙහි සේවක කැපවීම හා උනන්දුව වැඩි වීම	1. අයදුම්කරුවන් රාශියක් අතරින් වඩාත්ම සුදුසු පුද්ගලයා තෝරා ගත හැකි වීම
2. අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ ශක්තීන් හා දුර්වලතා පිළිබඳව කළමනාකාරීත්වය දැන සිටීම	2. ඉහළ සුදුසුකම් ඇති පුද්ගලයෙකු තෝරා ගැනීමේ හැකියාව
3. අනුස්ථාපන කාලය හා පිරිවැය අඩු වීම	3. නව අදහස් ආකල්ප සහිත පුද්ගලයන් ආකර්ෂණය කර ගත හැකි වීම
4. අනෙකුත් කළමනාකරුවන්ට උසස්වීම් ලබා ගැනීමේ අවස්ථාව වැඩි වීම	

(වාසි 02කට ලකුණු 01යි) **(වාසි 02කට ලකුණු 01යි)**

(ආ) 1. කාර්මික ආරවුල් අවම වීම
2. ශ්‍රම පිරිවැටුම හා ප්‍රවාසිතාව අඩුවීම
3. සේවකයන් අභිප්‍රේරණය වීම
4. ආයතනයේ කටයුතු සුමට ලෙස ගලා යාම
5. සම්පත් නාස්තිය අවම වීම
6. සේවක ඵලදායීතාවය ඉහළ යාම

(කරුණු 04කට ලකුණු 02යි)

(v) 1. පෞද්ගලික තොරතුරු
i. නම
ii. ලිපිනය
iii. උපන්දිනය
iv. විවාහක / අවිවාහක බව
v. දුරකථන අංකය

(ලකුණු 01යි)

2. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් **(ලකුණු 01යි)**

3. සේවා පළපුරුද්ද, විශේෂ ලැදියාවන් හා විෂය බාහිර කටයුතු **(ලකුණු 01යි)**

4. අයදුම්කරුගේ ශක්තීන් **(ලකුණු 01යි)**

5. තොරතුරු ලබා ගත හැකි පුද්ගලයන්

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



7 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 51%කි. (ප්‍රස්තාරය 02) II කොටසින් අඩුම සිසු පිරිසක් තෝරාගෙන ඇති ප්‍රශ්නය මෙයයි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 38%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 10%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 41%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 59%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 8 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (iv) (අ) වන අතර එහි පහසුතාව 67%කි. එසේම පහසුතාව අඩුම කොටස (ii) (ආ) වන අතර එහි පහසුතාව 27% කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාව ප්‍රස්තාරයෙන් දැක් වේ.

(i) ''ආ'' අනු කොටස සඳහා පහසුතාව 29%කි. මෙම ප්‍රශ්නය තුළින් ප්‍රශ්න 04ක පහසුතා මට්ටම මැනීමට අපේක්ෂා කර ඇති අතර, සියලුම ක්ෂේත්‍රවලට පිළිතුරු නොසැපයීම පහසුතාවය අඩු වීමට හේතුවයි.

(ii) ''අ'' අනු කොටසෙහි පහසුතාව 30%කි. මෙහිදී ලාභය හා ලාභදායකත්වය යන සංකල්පවල වෙනස්කම් අවබෝධ කර ගෙන නොමැති බව පෙනේ. එබැවින් මෙම සංකල්ප පිළිබඳව දැනුම වර්ධනය කර ගැනීමට වැඩි අවධානයක් යොමු විය යුතුයි.

මෙහි (ii) ''ආ'' කොටසෙහි පහසුතාව 27%කි. අයදුම්කරුවන්ට ණය සාධ්‍යකරණය පිළිබඳව අවබෝධයක් ඇතත් එය මූල්‍ය මාර්ගයක් ලෙස යොදා ගත හැකි ආකාරය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම ප්‍රමාණවත් නොවන නිසා මෙහි පහසුතාව අඩු වී ඇති බව පෙනී යයි.

(iii) අනු කොටසෙහි පහසුතාව 48%කි. ව්‍යාපාරයක අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම, මානව සම්පත් කළමනාකරණය පිළිබඳව න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව භාවිතයට ගැනීමේ නිපුණතාව සිසුන් තුළ ප්‍රමාණවත් නොවීම මෙහි පහසුතාව අඩු වීමට හේතුවයි. න්‍යායාත්මකව ඉගෙනගත් කරුණු ප්‍රායෝගිකව භාවිතයට හුරු කිරීමට සිසුන් යොමු කිරීම තුළින් මෙම තත්ත්වය මගහරවා ගත හැකිය.

8 ප්‍රශ්නය

8. (i) "ව්‍යාපාර ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් උද කිරීමට අන්තර්ජාලය *(Internet)* මහෝපකාරී වී තිබේ." ඉහත ප්‍රකාශය ගැන ඔබේ අදහස් දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) (අ) තොරතුරු පද්ධතිය *(Information system)* යනු කුමක් දැ'යි පැහැදිලි කරන්න.

(ආ) තොරතුරක අවශ්‍යයෙන් ම තිබිය යුතු ගුණාංග **හතරක්** නම් කර, කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(iii) ව්‍යාපාර ආයතනයක් ගනුදෙනු සැකසුම් පද්ධතිය තුළ භාවිතයට ගන්නා පරිගණක වැඩසටහන් **දෙකක්** ද කාර්යාලීය ස්වයංක්‍රීය පද්ධති තුළ භාවිතයට ගන්නා පරිගණක වැඩසටහන් **දෙකක්** ද නම් කරන්න. *(ලකුණු 04 යි)*

(iv) නව ව්‍යාපාරයක් බැංකු ණයක් ඉල්ලුම් කළ අවස්ථාවක, බැංකු කළමනාකරු, එම ව්‍යාපාරයේ සැලසුම *(Business plan)* පරීක්ෂා කිරීමට උනන්දු වන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

(v) පහත දක්වෙන්නේ ව්‍යාපාර සැලසුමක ඇතුළත් වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් 2014 ජනවාරි හා පෙබරවාරි මාස සඳහා උපුටා ගත් සාරාංශයකි.

වසර 2014	**ජනවාරි** **රුපියල් (000)**	**පෙබරවාරි** **රුපියල් (000)**
මුදල් ගලා ඒම		
අත්පිට විකිණුම්	60	80
ණය ගැතියන්ගෙන් ලැබීම්	20	(A) ?
බැංකුණය	(B) ?	60
මුළු මුදල් ගලා ඒම	130	170
මුදල් ගලා යාම		
තොග	70	(C) ?
කුලී *(rent)*	10	10
පොලී	5	6
වැටුප්	8	10
වෙනත් වියදම්	30	40
මුළු මුදල් ගලා යාම	123	146
ශුද්ධ මුදල් ප්‍රවාහය	(D) ?	(E) ?
ආරම්භක ශේෂය	3	(F) ?
අවසාන ශේෂය	(G) ?	(H) ?

A, B, C, D, E, F, G සහ **H** යන ස්ථානවලට අදළ වටිනාකම් යොදා මෙම මුදල් ප්‍රවාහය සම්පූර්ණ කරන්න.

(සැ.යු. - මෙය නැවත ලිවීම අවශ්‍ය නැත.)

ඔබ කළ යුත්තේ,

A = ... B = ... C = ... D = ...

E = ... F = ... G = ... H = ...

වශයෙන් ලියා දක්වීම පමණි. *(ලකුණු 04 යි)*

(මුළු ලකුණු 20 යි)

8. **(i)**
- ★ සමස්ථ ලෝකයම එකම වෙළෙඳපොළක් බවට පත් කිරීමට අන්තර්ජාලයට හැකි වී ඇත.
- ★ එම නිසා ව්‍යාපාරිකයන්ට විශාල වෙළෙඳපොළ අවස්ථා උදා වී ඇත.
- ★ තොරතුරු විශාල ප්‍රමාණයක් ලබා ගැනීමේ හැකියාව වර්ධනය වී ඇත.
- ★ යාවත්කාලීන කරන ලද තොරතුරු ලබා ගත හැකි වීම.
- ★ විද්‍යුත් ව්‍යාපාර මගින් ව්‍යාපාරිකයා ගනුදෙනුකරු වෙත ප්‍රවිශ්ඨ වීම.
- ★ E - money, E - banking ආදිය ව්‍යාප්ත වීම
- ★ ප්‍රවාහනයේ දියුණුව E - Ticketing
- ★ විද්‍යුත් තැපෑල
- ★ ප්‍රචාරණ කටයුතු ව්‍යාප්ත වීම
- ★ සෘජු වෙළෙඳාම

(අන්තර්ජාලය ව්‍යාපාර ව්‍යාප්තියට බලපා ඇති ආකාරය සඳහන් සම්පූර්ණ පිළිතුරට ලකුණු 04යි)
(පිළිතුර අනුව ප්‍රමාණවත් ලකුණු දෙන්න.)

(ii) (අ) සංවිධානයක තීරණ ගැනීම හා පාලනය සඳහා සහාය වන තොරතුරු රැස්කිරීම, සැකසීම, ගබඩා කිරීම හා බෙදා හැරීම සඳහා වූ අන්තර් සම්බන්ධතාවයකින් යුතු උපාංගවල එකතුවකි. **(නිවැරදි පැහැදිලි කිරීමට ලකුණු 02යි)**

(ආ)
- පූර්ණ බව
- නිවැරදි බව
- අදාලත්වය
- තේරුම්ගත හැකි වීම
- විශ්වාසවන්ත බව
- කාලීන බව

(කරුණකට 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02යි)

(iii) <u>ගනුදෙනු සැකසුම් පද්ධති</u>
ගිණුම්කරණ, තොග පාලනය
වැටුප් වාර්තා **(කරුණු 02කට ලකුණු 02යි)**

<u>කාර්යාලීය ස්වයංක්‍රීය පද්ධතිය</u>
Word, Data base
Desktop, Publishing, Digital filing, E-mail, Voice mail, Video conference
(කරුණු 02කට ලකුණු 02යි)ට

(iv)
i. බැංකු ණය හා පොළිය ආපසු ලබා ගැනීමේ හැකියාව දැන ගැනීමට (මූල්‍ය ශක්‍යතාව)
ii. ව්‍යාපාරයේ ස්වභාවය දැන ගැනීමට
iii. වෙළෙඳපොළ ස්වභාවය
iv. කළමනාකරණ කණ්ඩායම් පිළිබඳ දැනගැනීමට
v. වෙළෙඳපොළ ලාභදායකත්වය දැන ගැනීමට
vi. ව්‍යාපාරයේ අනාගත ප්‍රවණතා **(කරුණු 04කට ලකුණු 04යි)**

(v)

A - 30	B - 50	C - 80	D - 07
E - 24	F - 10	G - 10	H - 34

(ලකුණු 04යි)

8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



8 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 57%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 18%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 44%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 9%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 38%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 62%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 6 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (i) වන අතර එහි පහසුතාව 97%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (iii) කොටස වන අතර එහි පහසුතාව 23% කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාව ප්‍රස්තාරයෙන් දැක් වේ.

(ii) ''අ'' අනු කොටසෙහි පහසුතාව 28%කි. මෙයට හේතුව තොරතුරු පද්ධති නිවැරදිව අර්ථ දැක්වීමට නොහැකි වී ඇති බව පෙනේ. තොරතුරු පද්ධති හා ඒවා අතර අන්තර් සම්බන්ධතාවය සහ ඒවායේ උපාංගවල එකතුව පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ද අයදුම්කරුවන් සතු නොවන බව පෙනේ.

(iii) අනු කොටසෙහි පහසුතාවය 23%කි. ව්‍යාපාර ආයතනයක පරිගණක භාවිතය පිළිබඳව සංකල්පීය දැනුම ඇතත් ඒවායේ ප්‍රායෝගික භාවිතය පිළිබඳව සිසුන්ගේ දැනුම ප්‍රමාණවත් නොවන බව පෙනේ. එදිනෙදා ව්‍යාපාර කටයුතු හා සම්බන්ධව පරිගණක පද්ධති භාවිතය හා පරිගණක වැඩසටහන් පිළිබඳව ක්‍රියාකාරකම් ආශ්‍රිත දැනුම වැඩි කළ යුතු බව පෙනේ. මේ සඳහා ඉදිරිපත් කිරීම් (Presentations), ආධාරක භාවිතා කළ යුතු ය.

(iv) අනු කොටසෙහි පහසුතාවය 41% කි. එයට හේතුව ව්‍යාපාර සැලසුමක් බැංකු කළමනාකරුවකුට වැදගත් වීමට, ඒ ගැන ඔවුන් උනන්දු වීමට හේතූන් පිළිබඳව ප්‍රමාණවත් දැනුම අයදුම්කරුවන් සතු නොවීම බව පෙනේ. ඒ අනුව ව්‍යාපාර සැලැස්මක ඇති වැදගත්කම බැංකු කළමනාකරුවකුගේ දෘෂ්ටියෙන් ඉදිරිපත් කිරීමට සිසුන්ට මඟ පෙන්විය යුතුයි.

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



දෙවන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 01, 02, 03 හා 04 යන ප්‍රශ්න I වන කොටසට අයත් වේ. ප්‍රශ්න 05, 06, 07 හා 08 යන ප්‍රශ්න II කොටසට අයත් වේ. එම කොටස් දෙකෙන් අවම වශයෙන් එක කොටසකින් ප්‍රශ්න දෙකක් බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු වේ.

I කොටසේ 61%ක් වූ ඉහළම පහසුතාවන් දැකිය හැක්කේ තුන්වන ප්‍රශ්නයට වන අතර, අඩුම පහසුතාව වූ 43% දැකිය හැක්කේ හතරවන ප්‍රශ්නයට ය.

II කොටසේ 67%ක් වූ ඉහළම පහසුතාවය පස්වන ප්‍රශ්නය සඳහාත්, අඩුම පහසුතාවය වූ 42% හයවන ප්‍රශ්නය සඳහාත් දැකිය හැකි ය.

I වන හා II වන කොටස්වල සමස්ත පහසුතාව විමසා බැලීමේ දී I කොටසේ සාමාන්‍ය සමස්ත පහසුතාව 53.5%කි. එමෙන්ම II කොටසේ සාමාන්‍ය සමස්ත පහසුතාව 52.5% කි.

III කොටස

3 **පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :**

3.1 **පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :**

පොදු උපදෙස් :

* අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුයි.
* ප්‍රශ්න පත්‍රයේ සඳහන් කර ඇති මූලික උපදෙස් හොඳින් කියවා නිවැරදිව තේරුම් ගත යුතු ය.
* ප්‍රශ්න පත්‍රයේ එක් එක් කොටස්වලින් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව, අනිවාර්ය ප්‍රශ්න මොනවා ද?, ප්‍රශ්නයට ලැබෙන ලකුණු ප්‍රමාණය, පිළිතුරු සැපයීමට ලැබෙන කාලය පිළිබඳ නිරවුල් අවබෝධයක් පළමුව ලබා ගත යුතු ය.
* පිළිතුරු ලිවීමේදී දම්, රතු සහ කොළ පාට පැන් සහ පැන්සල් භාවිත කිරීමෙන් වැළකිය යුතු ය. (භාවිත කළ යුත්තේ නිල් සහ කළු පැන් පමණි.)
* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය.

I වෙනි ප්‍රශ්න පත්‍රය සඳහා උපදෙස් :

* ප්‍රශ්න 50කින් සමන්විත වන අතර, කාලය පැය 02 කි.
* ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා බහුවරණ ප්‍රශ්න සඳහා නියමිත ස්ථානයේ නිවැරදි වරණයේ අංකය පැනකින් සටහන් කළ යුතු යි.
* ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ හිස්තැනෙහි සුදුසු වචන ලියා හිස්තැන් පිරවිය යුතු යි.
* ප්‍රශ්න අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු අදාළ ස්ථානයේ සටහන් කළ යුතු යි.

II වෙනි ප්‍රශ්න පත්‍රය සඳහා උපදෙස් :

* ප්‍රශ්න පත්‍රයේ මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි.
* විභාග අයදුම්කරු පිළිතුරු සැපයීමේ දී I කොටස හා II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් බැගින් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතු ය. නියමිත කාලය පැය 03 කි.
* ඒ ඒ ප්‍රශ්නය යටතේ ප්‍රශ්න අනු කොටස් සියල්ලටම නිවැරදි ඉලක්ක ගත පිළිතුරු ලිවිය යුතු ය.
* තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව අදාළ කරුණු ඉදිරිපත් කළ යුතු ය.

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

* ව්‍යාපාර අධ්‍යයනය විෂයයේ ස්වභාවය පිළිබඳ ව ගුරුවරයා ගැඹුරු හා පුළුල් අවබෝධයකින් ද යාවත්කාලීන වූ දැනුමකින් ද යුතුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ප්‍රවේශ විය යුතුය. ව්‍යාපාර අධ්‍යයනය දිනෙන් දින වෙනස් වන විෂය කරුණු රාශියකින් යුක්ත වේ. එමනිසා එම වෙනස්වීම් පිළිබඳ ව දැනුවත් වීමට ගුරුවරයා සමත් විය යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂය න්‍යායාත්මක දැනුමෙන් ඔබ්බට විහිදෙන විෂයයකි. එම නිසා එම විෂයයට ආදරය කිරීමටත් එම විෂය ක්ෂේත්‍රය තුළ ජීවත්වීමටත් (Love & Live) ගුරුවරයා සමත් විය යුතු අතර ඒ සඳහා සිසුන්ට මඟ පෙන්වීමක් ද කළ යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂය උගන්වන ගුරුවරයා පන්ති කාමරය තුළ සිදුවන සාමාන්‍ය ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියට අමතරව කණ්ඩායම් ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර චාරිකා, ව්‍යාපෘති, ප්‍රදර්ශන, ඉදිරිපත් කිරීම් වැනි ක්‍රියාකාරකම් විෂයය පිළිබඳ ව දැනුවත් කිරීම සඳහා භාවිත කළ යුතුය. මෙම ක්‍රියාකාරකම්වලදී සිසුන්ගේ උපරිම සහභාගිත්වය සඳහා ඉඩ සැලසෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

* විෂය දැනුම තහවුරු කිරීමේදී පහසුකම් අනුව වීඩියෝ දර්ශන, පරිගණක මෘදුකාංග, අන්තර්ජාල භාවිතය වැනි අවස්ථාද බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර වැනි නවීන තාක්ෂණික උපක්‍රම ද භාවිත කිරීම වඩා සුදුසුය.

* විෂය අවබෝධය හා දැනුම යාවත්කාලීන කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන, වාර්ෂික අයවැය යෝජනා, විෂයයට අදාළ අණ පනත්, නියෝග, නීතිරීති ආයතනික පහසුකම් සපයන සංවිධානවල නිල ප්‍රකාශන පරිශීලනය කළ යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශයේ අභිමතාර්ථ පරීක්ෂා කිරීමේදී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් ඉටුකර ගත යුතු සුවිශේෂී අභිමතාර්ථ පද්ධතියක් ඇත. එම අභිමතාර්ථ ප්‍රධාන වශයෙන් එදිනෙදා ජීවිතයට අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප ලබාදෙන පරිදි සකස් කර ඇත. මීට අමතරව අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනැගෙන ජීවන පුරුදු බවට ඉගෙනුම් ඵලය සකස් විය යුතුය. එම අභිමතාර්ථ සාක්ෂාත් කරගත හැකිවන පරිදි ව්‍යාපාර අධ්‍යයනය විෂය ඉගැන්වීමේදී විවිධ ක්‍රම අනුගමනය කිරීමට ගුරුවරයා සැලකිලිමත් විය යුතුය. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මගින් පෙන්වා දෙන මගපෙන්වීම් ඔස්සේ ගුරුහවතා විසින් උචිත ක්‍රමවේද භාවිත කිරීම සාර්ථක ඉගෙනුම්- ඉගැන්වීම් වැඩ පිළිවෙළකට හේතුවනු ඇත.

* ගුරුවරයා තම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුරදී සිසුන් ඇගයීමට ලක්කළ යුතුය. පන්ති කාමරය තුළ ශිෂ්‍යයන් ඉගෙනීමෙහි යෙදී සිටින අතරතුරදී ගුරුවරයාට සිසුන්ගේ ඉගෙනුම් හැකියා, නොහැකියා හා ප්‍රවීණතා පිළිබඳ ව අවබෝධ කරගැනීමට එමඟින් හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුරදීම සිසුන්ගේ දුර්වලතා හඳුනා ගෙන ඒ සඳහා ප්‍රතිපෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ගුරුවරයා විසින් සැලසුම් සකසා ගත යුතුය.

* වාණිජ අධ්‍යයනය විෂයේ II ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය. මෙහි I වන කොටස 12 වන ශ්‍රේණියටත් II වන කොටස 13 වන ශ්‍රේණියටත් අදාළ වේ. සමස්ත ඇගයීම් දෙස බලන විට පෙනී යන්නේ I වන කොටස සඳහා වැඩිපුර ලකුණු ලබා ගෙන ඇති තත්ත්වයක් වුව ද II වන කොටස සඳහා අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ඇති තත්ත්වයකි. එම නිසා 13 වන ශ්‍රේණියට අදාළ පාඩම් ඒකක කෙරෙහි වැඩි අවධානයක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොමු කළ යුතුය. ඒ සමඟම II වන කොටසේ ප්‍රශ්නවලට සිසුන් වැඩියෙන් පුරුදු පුහුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව වටහාගත යුතුව ඇත.

* අ.පො.ස. (උසස්.පෙළ) වාණිජ අධ්‍යයනය ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු සපයා ඇති ආකාරය දෙස බලන විට වාණිජ අධ්‍යයනය විෂයය හා සම්බන්ධ සංකල්ප, පාරිභාෂික පද, නව ප්‍රවණතා පිළිබඳ ව සිසුන් තුළ ඇති දැනුම ප්‍රමාණවත් නොවන බව පෙනී යයි. එමෙන්ම පිළිතුරු නිවැරදි ව ගළපා පැහැදිලි ව ඉදිරිපත් කිරීමට සිසුන් නිපුණතාව ලබා නොමැති බවද පෙනී යන තවත් කරුණකි. එම නිසා එම කරුණු කෙරෙහි පන්ති කාමර ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේදී අවධානය යොමු කළ යුතුය.